සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
சுகததாச தேசிய விளையாட்டு கட்டத் தொகுதி அதிகார சபை
Sugathadasa National Sports Complex Authority



# වාර්ෂික වාර්තාව

# வருடாந்த அறிக்கை

# Annual Report

# 2020

# වාර්ෂික වාර්තාව
# 2020

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**

**ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය**



**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**
**1999 අංක 17 දරන පාර්ලිමේන්තු පනත හා**
**2017 අංක 14 දරන (සංශෝධන පනත) මඟින් නීතිගත කර ඇත.**

1. හැඳින්වීම
2. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ කළමනාකාරීත්ව මණ්ඩලය
3. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටුව
4. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මාණ්ඩලික නිලධාරීන්
5. අපගේ දර්ශනය සහ මෙහෙවර
6. ආයතනයේ සංවිධාන ව්‍යුහය
7. අනුමත කාර්ය මණ්ඩලය
8. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ අරමුණු
9. අධිකාරියේ වගකීම් හා කාර්යයන්
10. පහසුකම් සහ සේවා සපයනු ලබන ක්ෂේත්‍ර
11. මානව සම්පත් සංවර්ධනය
12. කළමනාකාරීත්ව වාර්තාකරණය
13. කළමනාකාරීත්ව මණ්ඩල රැස්වීම් - 2020
14. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ විගණන කාර්යය - 2020
15. භාණ්ඩ සමීක්ෂණය - 2020
16. වාර්ෂික ප්‍රසම්පාදනය
17. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය
18. ගෘහස්ථ ක්‍රීඩාගාරය
19. උප ක්‍රීඩාගාරය
20. පිහිණුම් තටාක සංකීර්ණය
21. කායවර්ධන මධ්‍යස්ථානය
22. ක්‍රීඩා හෝටලය
23. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය
24. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේ 2021 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති
25. සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය
26. සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය
27. සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ 2021 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති
28. අනුබද්ධ ආයතන හා ක්‍රීඩාංගණ පරිශ්‍ර
29. බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණය
30. බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය
31. බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණයේ 2021 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති
32. නුවරඑළිය තුරඟ තරග පිටිය
33. බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තටාක
34. ආර් ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය
35. ගිණුම්කරණ ප්‍රතිපත්ති 2020
36. මූල්‍ය ප්‍රකාශ
37. ආදායම් වියදම් ප්‍රකාශය
38. ශේෂ පත්‍රය
39. අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය
40. ක්‍රීඩාංගණ අනුව ආදායම 2020
41. ආයතනයේ සමස්ථ ප්‍රගතිය
42. ආයතනයේ මුළු ණය
43. විගණකාධිපති වාර්තාව 2020
44. විගණකාධිපති වාර්තාව සඳහා යාවත්කාලීන තොරතුරු

## හැඳින්වීම



සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය භාරකාර අරමුදලක් ලෙස 1995.02.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රීඩා අමාත්‍යාංශයට පවරා ගනු ලැබූ අතර, 1999 අප්‍රේල් මස 20 වෙනි දින සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියක් බවට පත් කිරීමේ 1999 අංක 17 දරන පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එකී පනතින් 1999.09.01 දින සිට බලපාන සේ සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ලෙස ස්ථාපිත කරන ලදී.

කාලීන අවශ්‍යතාව මත කළමනාකාරීත්ව මණ්ඩල උපදෙස් හා අනුමැතියට අනුව ප්‍රධාන ප්‍රඥප්තියේ වගන්ති සංශෝධනය කර 2017 අගෝස්තු මස 28 දින පාර්ලිමේන්තුවේ සභා සම්මත කරන ලද 2017 අංක 14 දරන (සංශෝධන) පනත ද මීට අදාළ වේ.

මෙම අධිකාරියේ කළමනාකරණ කටයුතු සඳහා එකොළොස් දෙනෙකුගෙන් (11) සමන්විත කළමනාකාරිත්ව මණ්ඩලයක් මඟින් සිදු කරන අතර, එම මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

- ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ නියෝජිතයෙකු.
- ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 5 දරන ක්‍රීඩා පනත යටතේ පත් කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්.
- භාණ්ඩාගාරයේ නියෝජිතවරයෙකු ඇතුළු ව,
- ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපති, ක්‍රියාකාරී අධ්‍යක්ෂ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ 08 දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් පත් කරනු ලැබේ.

### 2020.02.07 දින පත්කරන ලද කළමනාකාරිත්ව මණ්ඩලය

1. නලින්ද ඉලංගකෝන් මහතා - සභාපති
2. පී.පී.කේ.අබේසිරිගුණවර්ධන මහත්මිය - සාමාජික
   (අතිරේක ලේකම් - ක්‍රීඩා අමාත්‍යාංශය)
3. ඒ.ජේ.එස්.එස්.එදිරිසූරිය මහතා - සාමාජික
   (අධ්‍යක්ෂ ජනරාල් - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව)
4. ඉන්දික ප්‍රේමරත්න මහතා - සාමාජික
   (අධ්‍යක්ෂ - මුදල් අමාත්‍යාංශය)
5. වයි.කේ.කුලරත්න මහතා - සාමාජික
6. අනිල් වීරසිංහ මහතා - සාමාජික
7. සී.ඒ.නිරෝෂ නදුන් - සාමාජික
8. එම්.වී.ජී.රම්‍යචන්ද්‍ර ගුණසේකර - සාමාජික
9. ඩී.ඩබ්.ප්‍රතාපසිංහ මහතා - සාමාජික
10. එච්.වී.ජී.ආර්.ගුණසේකර මහතා - සාමාජික
11. අනුර රණසිංහ මහතා - සාමාජික
12. අයි.එම්.රණසිංහ මහතා - සාමාජික

### විගණන හා කළමනාකාරිත්ව මණ්ඩලය - 2020.12.31 දිනට

1. ඉන්දික ප්‍රේමරත්න මහතා - කමිටු සභාපති
   (අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය)
2. පී.පී.කේ.අබේසිරිගුණවර්ධන මිය - කමිටු සාමාජික
   (අතිරේක ලේකම්, තරුණ කටයුතු අමාත්‍යාංශය)
3. ඒ.ජේ.එස්.එස්.එදිරිසූරිය මහතා - කමිටු සාමාජික
   (අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව)
4. ඩී.එම්.ප්‍රතාපසිංහ මහතා - කමිටු සාමාජික
5. අනිල් වීරසිංහ මහතා - කමිටු සාමාජික
6. එස්.එන්.හපුආරච්චි මිය - නිරීක්ෂණ මට්ටමේ සහභාගිත්වය
7. එච්.ඩී.පුද්ධි පෙරේරා මහතා - නිරීක්ෂණ මට්ටමේ සහභාගිත්වය

## අධිකාරියේ මාණ්ඩලික නිලධාරීන් - 2020.12.31 දිනට

- අධ්‍යක්ෂ - එස් එස් කේ ගුණවර්ධන මහතා
- සහකාර අධ්‍යක්ෂ (පාලන) - සී අනුරාධ විදානගමාච්චි මහතා
- සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) - ඩබ් එම් පී එස් බණ්ඩාර පියදාස මහතා
- සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) - ඩබ් එම් වයි ඒ විජේසූරිය මෙනවිය
- නීති නිලධාරි - එච් කේ එම් කේ රාජිත මහතා
- පරිපාලන නිලධාරි - එච් අනෝජා ප්‍රියදර්ශනී මිය
- තොරතුරු තාක්ෂණ නිලධාරි - කේ බන්දුතිලක මහතා
- ක්‍රීඩාංගණ කළමනාකරු (ගෘහස්ථ) - ඩී ඩී එස් ලියනාරච්චි මිය
- ක්‍රීඩාංගණ කළමනාකරු (එළිමහන්) - පී ඩී එන් ප්‍රභා කිරිඇල්ල මිය
- ක්‍රීඩාංගණ කළමනාකරු (වෙන්කිරීම්) - පී ඩී සම්පත් පෙරේරා මහතා
- ක්‍රීඩාංගණ කළමනාකරු (බෝගම්බර) - එස් සී වික්‍රමසූරිය මහතා
- මිලදීගැනීම්/ අලෙවි නිලධාරි - එස් කේ ඩී ශානිකා ප්‍රභාෂ්වරී මෙනවිය
- ගිණුම් නිලධාරි - එම් එන් දිසානායක මෙනවිය - ගිණුම් නිලධාරී
- ආරක්ෂක කළමනාකරු (ගෘහස්ථ) (වැ.බ) - ඩබ් ඩී සමරතුංග මහතා

<u>සම්පාදනය</u>

**අධීක්ෂණය :**
විමල් එස් කේ ලියනගම (අධ්‍යක්ෂ - වැ.බ.)
එච් අනෝජා ප්‍රියදර්ශනී (සහකාර අධ්‍යක්ෂ (පාලන) - වැ.බ. )

**පරිඝණක යතුරු ලියනය/පෙළගැස්ම :**
තිළිණ සශිරංග මුතුනායක (කළමනාකරණ සහකාර)

**භාෂා පරිවර්තනය (දෙමළ,ඉංග්‍රීසි) :**
එම් නුස්රාත් මහතා (රජයේ භාෂා පරිවර්තක)

**මුද්‍රණය :** සැලැසිනෙ රූපවාහිනී ආයතනය

**බැංකුව**
ලංකා බැංකුව - ග්‍රෑන්ඩ්පාස් ශාඛාව

**ලිපිනය**
සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ
අධිකාරිය,
තැ.පෙ. 2211, ආතර් ද සිල්වා මාවත,
කොළඹ 13.

**දුරකථන :** 011-2445677,
2384385

**ෆැක්ස් :** 011-2445675

**විද්‍යුත් තැපැල :**
sugathadasaindoor@gmail.com

# අපගේ දර්ශනය හා මෙහෙවර

## දැක්ම

ආසියාවේ පළමු පෙළේ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා පහසුකම් සහිත ක්‍රීඩා සංකීර්ණයක් බවට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පත් කිරීම සහ එය සතු අනෙකුත් ක්‍රීඩා සංකීර්ණ දියුණු කිරීම තුළින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංවර්ධනයට පහසුකම් සහනදායී ව ලබා දීම.

## මෙහෙවර

ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම මඟින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුවට දායකවීම සහ ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා ඔප් නැංවීමට අවැසි පහසුකම් සහිත ප්‍රමුඛතම ජාත්‍යන්තර සංකීර්ණයක් බවට පත්වීම.



**සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය**

<u>ආයතනයේ සංවිධාන ව්‍යුහය</u>



# අනුමත කාර්ය මණ්ඩලය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ආයතනයේ සේවා අවශ්‍යතාව මත අනුමත කාර්ය මණ්ඩල තොරතුරු වලට අනුව අනුමත කාර්ය මණ්ඩලය 378ක් වන අතර එක් තනතුරක් කොන්ත්‍රාත් පදනම මත අනුමත කර ඇත. මින් 2020.12.31 දිනට සේවයේ යෙදී සිටින ස්ථිර සේවක සංඛ්‍යාව 310ක් වේ. එම අනුමත සේවක සංඛ්‍යාවෙන් ආයතනයේ සේවය කළ සේවක සංඛ්‍යාව 82.01%ක් පමණ වන අතර එය පහත පරිදි දැක්විය හැකිය.

| තනතුර | වැටුප් කාණ්ඩය | අනුමත ස්ථිර සේවක සංඛ්‍යාව | කොන්ත්‍රාත් පදනම මත අනුමත සේවක සංඛ්‍යාව | 2020.12.31 දිනට සේවක සංඛ්‍යාව | 2020.12.31 දිනට කොන්ත්‍රාත් පදනම මත සේවක සංඛ්‍යාව | පුරප්පාඩු/ අතිරික්ත |
|---|---|---|---|---|---|---|
| සභාපති | | | | | | |
| ක්‍රියාකාරී අධ්‍යක්ෂ | | | | | | |
| **ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමනාකරු** | | | | | | |
| අධ්‍යක්ෂ | HM 1-1 | 1 | - | 1 | - | 0 |
| **මධ්‍යම මට්ටමේ කළමනාකරු** | | | | | | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (පාලන) | MM 1-3 | 1 | - | 1 | - | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | MM 1-3 | 1 | - | 1 | - | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) | MM 1-3 | 1 | - | 1 | - | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණික) | MM 1-3 | 1 | - | 1 | - | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (විදුලි/කාර්මික) | MM 1-3 | 1 | - | 0 | - | 1 |
| නීති නිලධාරි | MM 1-3 | 1 | - | 1 | - | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (තො.තා/මාධ්‍ය) | MM 1-3 | 1 | - | 0 | - | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | MM 1-3 | 1 | - | 0 | - | 1 |
| භූමි පාලක උපදේශක | MM 1-3 | 1 | - | 0 | - | 1 |
| **කනිෂ්ඨ කළමනාකරු** | | | | | | |
| සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් | JM 1-1 | 0 | 1 | - | - | 0 |
| අභ්‍යන්තර විගණක | JM 1-1 | 1 | - | 0 | - | 1 |
| පරිපාලන නිලධාරි | JM 1-1 | 1 | - | 1 | - | 0 |
| ගිණුම් නිලධාරි | JM 1-1 | 1 | - | 1 | - | 0 |
| තොරතුරු තාක්ෂණ නිලධාරි | JM 1-1 | 1 | - | 1 | - | 0 |
| නඩත්තු නිලධාරි | JM 1-1 | 1 | - | 0 | - | 1 |
| මිලදී ගැනීමේ නිළධාරි/ අලෙවි නිලධාරි | JM 1-1 | 1 | - | 1 | - | 0 |
| ප්‍රසම්පාදන නිලධාරි | JM 1-1 | 1 | - | 0 | - | 1 |
| ආරක්ෂක කළමනාකරු | JM 1-1 | 1 | - | 0 | - | 1 |
| ක්‍රීඩාංගණ කළමනාකරු (ශාහස්ථ) | JM 1-1 JM 1-1 | 1 | - | 1 | - | 0 |
| ක්‍රීඩාංගණ කළමනාකරු (එළිමහන්) | JM 1-1 | 1 | - | 1 | - | 0 |
| ක්‍රීඩාංගණ කළමනාකරු (බෝගම්බර) | JM 1-1 | 1 | - | 1 | - | 0 |
| ක්‍රීඩාංගණ කළමනාකරු | | 1 | - | 1 | - | 0 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (බෙලිඅත්ත) | | | | | | |
| **කළමනාකරණ සහකාර (තාක්ෂණික)** | | | | | | |
| තාක්ෂණික සහකාර (සිවිල්) | MA 2-1 | 2 | - | 0 | - | 2 |
| තාක්ෂණික සහකාර (විදුලි) | MA 2-1 | 2 | - | 1 | - | 1 |
| ගබඩා භාරකරු | MA 2-1 | 3 | - | 2 | - | 1 |
| පොත් තබන්නා | MA 2-1 | 1 | - | 1 | - | 0 |
| තාක්ෂණික සහකාර (කාර්මික/මෝටර්) | MA 2-1 | 1 | - | 0 | - | 1 |
| තොරතුරු තාක්ෂණ සහකාර | | 2 | - | 0 | - | 2 |
| **කළමනාකරණ සහකාර (තාක්ෂණික නො වන)** | | | | | | |
| කළමනාකරණ සහකාර | MA 1-1 | 32 | - | 28 | - | 4 |
| භූමි පාලක | MA 1-1 | 1 | - | 1 | - | 0 |
| වැඩ පරීක්ෂක | MA 1-1 | 2 | - | 1 | - | 1 |
| ක්‍රීඩා නිලධාරී | MA 1-1 | 8 | - | 6 | - | 2 |
| ක්‍රීඩා පුහුණුකරු ** | MA 1-1 | 1 | - | 1 | - | 0 |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | MA 1-1 | 3 | - | 2 | - | 1 |
| ආරක්ෂක නිලධාරී | MA 1-1 | 18 | - | 18 | - | 0 |
| උද්‍යාන අලංකරණ සහකාර | MA 1-2 | 1 | - | 0 | - | 1 |
| **ප්‍රාථමික ශිල්පීය** | | | | | | |
| විදුලි කාර්මික ** | PL 3 | 1 | - | 1 | - | 0 |
| | PL 3 | 4 | - | 0 | - | 4 |
| රියදුරු | | 10 | - | 9 | - | 1 |
| **ප්‍රාථමික අර්ධ ශිල්පීය** | | | | | | |
| වඩු කාර්මික | | 3 | - | 3 | - | 0 |
| පෙදරේරු | | 3 | - | 3 | - | 0 |
| වැද්දුම්කරු | | 3 | - | 3 | - | 0 |
| පින්තාරු | | 3 | - | 3 | - | 0 |
| පැස්සුම්කරු | PL 2 | 3 | - | 2 | - | 1 |
| බයිසිකල් පණිවිඩකරු | | 2 | - | 1 | - | 1 |
| ජීවිතාරක්ෂක සහායක | | 4 | - | 0 | - | 4 |
| සම්භාහක | | 2 | - | 0 | - | 2 |
| අරක්කැමි | | 1 | - | 0 | - | 1 |
| **ප්‍රාථමික ශිල්පීය නො වන** | | | | | | |
| ක්‍රීඩාංගන සහායක | | 111 | - | 101 | - | 10 |
| ආරක්ෂක නියාමක | | 100 | - | 87 | - | 13 |
| කාර්යාල කාර්ය සහායක | PL 1 | 10 | - | 9 | - | 1 |
| පිහිණුම් තටාක සහායක | | 5 | - | 0 | - | 5 |
| බංගලා භාරකරු | | 1 | - | 0 | - | 1 |
| ක්‍රීඩාංගණ ලිපිකරු ** | | 13 | - | 13 | - | 0 |
| | එකතුව | **378** | **1** | **310** | **1** | **68** |

(**) තනතුර දරන්නාට පමණක් පෞද්ගලික වන ලෙස තනතුර අනුමත කිරීමේ දී බඳවාගැනීමේ පරිපාටියේ සුදුසුකම් අනුමත කර ඇත.

## අධිකාරියේ අරමුණු

- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය කළමණාකරණය කිරීම, නඩත්තු කිරීම, සුරැකීම සහ සංවර්ධනය කිරීම.
- ක්‍රීඩා ආර්ථිකයේ සහ ක්‍රීඩා සංචාරක ව්‍යාපාරයේ අවශ්‍යතා සපුරාලීමට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ ක්‍රීඩා හා විනෝදාත්මක කටයුතු හා පහසුකම් වැඩි දියුණු කිරීම.
- රටෙහි ක්‍රීඩා අභිවෘද්ධිය වෙනුවෙන් සුගතදාස ක්‍රීඩා සංකීර්ණයේ පවතින පහසුකම් සැපයීම.
- සමාජ ඒකාබද්ධතාවට හා ජාතිය ගොඩනැගීමට උපකාරී වන ක්‍රමවේද ලෙස ක්‍රීඩා හා විනෝදාත්මක කටයුතු යොදාගනු ලැබීම සහතික කිරීම .

## අධිකාරියේ වගකීම් සහ කාර්යයන්

## වගකීම්

- කළමනාකරණය කිරීම, නඩත්තු කිරීම සහ ජාතික වත්කමක් ලෙස සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- සියලු පහසුකම් සහ සේවා නඩත්තු කරගෙන යාම.
- ගොඩනැගිලිවලට හා ව්‍යුහවලට අවශ්‍යවන වැඩිදියුණු කිරීම් හෝ වෙනස්කිරීම් සිදු කිරීම.
- ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට හා විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට ක්‍රීඩාවෙහි ස්වකීය හැකියාව වැඩි දියුණු කරගැනීම සහ ඔවුන්ගේ කායවර්ධන හා සෞඛ්‍යය වැඩිදියුණු කරගැනීමට හැකිවන සේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත් ව පහසුකම් ඔවුනට ලබාදීම.
- විශේෂයෙන් ම ග්‍රාමීය අංශයවල ක්‍රීඩා වැඩි දියුණු කිරීමේ අරමුණ ඇති ව ක්‍රීඩා පිළිබඳ පුහුණු පාඨමාලා සහ වැඩසටහන් පවත්වාගෙන යාම.
- ජාතික හා අන්තර්ජාතික උත්සව සඳහා අවශ්‍ය පහසුකම් කළමනාකාරීත්ව මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත් ව ලබාදීම.
- ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සහ විනෝදාත්මක පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණ ඇති ව, ජාත්‍යන්තර සහ දේශීය ක්‍රීඩා පුහුණු සංවිධානය, ක්‍රීඩා ආයතන සමග සම්බන්ධීකරණය සහ සම්බන්ධතා ඇති කරගැනීම.
- අප අධිකාරියේ පහසුකම් කළමනාකාරීත්ව මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත් ව සාධාරණ ගාස්තුවකට පාසැල්වලට, තරුණ ක්‍රීඩා සමාජවලට සහ ක්‍රීඩා සංවිධානයවලට සැපයීම.

## කාර්යයන්

- ඉහත වගකීම් ඉටුකිරීමට අප අධිකාරිය විසින් පහත ක්‍රියාමාර්ග ගනු ලබන අතර, ජාතික ක්‍රීඩා සංගම්, පාසල් ක්‍රීඩා සංගම් හා රාජ්‍ය මෙන් ම පෞද්ගලික ආයතන සඳහා කළමනාකාරීත්ව මණ්ඩලය මගින් අනුමත කළ ගාස්තු යටතේ සේවා හා පහසුකම් සපයනු ලැබේ.
- ජාතික හා ජාත්‍යන්තර ජවන හා පිටිය ක්‍රීඩා තරග සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
- ජාත්‍යන්තර මට්ටමේ තරග දිවා කාලයේ දී මෙන් ම රාත්‍රී කාලයේ දී පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැපයීම.

- ○ අඩු පහසුකම් සහිත පාසැල් හා ග්‍රාමීය මට්ටමේ දක්ෂතා සපිරි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය යටිතල පහසුකම් සපයා දීම මඟින් ඔවුන්ගේ දක්ෂතා වැඩිදියුණු කරගෙන ඉදිරියට ඒමට අවශ්‍ය පහසුකම් සැපයීම.
- ○ ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පිහිණුම් තරග පැවැත්වීමට අවශ්‍ය පිහිණුම් හා කිමිදුම් තටාකාංගන පහසුකම් සැපයීම.
- ○ විභාග, සම්මන්ත්‍රණ, සමුළු හා උත්සව, විනෝද කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
- ○ පුහුණු වැඩමුළු සංවිධානය කිරීම.

## පහසුකම් සහ සේවා සපයනු ලබන ක්ෂේත්‍ර

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය සේවා ලාභීන්ගේ අවශ්‍යතාවට ගැළපෙන පරිදි ක්‍රීඩා පහසුකම් ලබාදීමට කටයුතු කරන අතර, පුළුල් ක්ෂේත්‍රයක සේවා පහසුකම් ලබාදීමට ක්‍රීඩාංගණ හා ක්‍රීඩාගාර අවශ්‍ය පරිදි සකසා දීමට කටයුතු කරනු ලැබේ.
ගෘහස්ථ ක්‍රීඩාංගණය, එළිමහන් ක්‍රීඩාංගණය හා බෝගම්බර ක්‍රීඩාංගණයන්හි ක්‍රීඩා පිටියවල පවත්වනු ලබන ක්‍රීඩා ඉසව් මෙන් ම සෙසු වැඩසටහන් පැවැත්වීම සඳහා දිවා කාලයේ මෙන් ම රාත්‍රී කාලයේ දී ද සේවා පහසුකම් උසස් ප්‍රමිතියකින් ලබාදීමට සැලසුම් කර ඇත. පාසැල් මට්ටමේ සිට දිස්ත්‍රික් තරග, පළාත් මට්ටමේ තරග නියෝජනය කරමින් ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන් ක්‍රීඩා ඉසව්වලින් ජාත්‍යන්තර තලය දක්වා යාමට අවශ්‍ය සේවා සහ පහසුකම් සකසා ඇති එක ම ආයතනය සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය යි.

## ගෘහස්ථ හා එළිමහන් ක්‍රීඩා

මලල ක්‍රීඩා, රගර්/පාපන්දු, දැල්පන්දු, ක්‍රිකට්, පැසිපන්දු, ස්කොෂ්, අත්පන්දු, බැඩ්මින්ටන්, මේසපන්දු, ජූඩෝ, මල්ලවපොර, වුෂු, බොක්සිං, ටයිකොන්ඩෝ, කරාතේ, ජිම්නාස්ටික්, පිහිණුම් ක්‍රීඩා වශයෙන් ක්‍රීඩාවන් පැවැත්වීම සඳහා ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම.



## සෞඛ්‍යය හා අධ්‍යාපනය

ආගමික වැඩසටහන්, ජාතික හා ජාත්‍යන්තර උත්සව, වැඩමුළු, පිහිණුම් පාසැල හා පුහුණු පාඨමාලා, ජීවිතාරක්ෂක පාඨමාලා, කායවර්ධන පාඨමාලා, සංදර්ශන, රැස්වීම් සඳහා ජාත්‍යන්තර මට්ටමේ සේවා සහ පහසුකම් සැපයීම.



විභජ්ජවාද වැඩසටහන - 2020

## විනෝදාස්වාදය

ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ මහා පරිමාණ සංගීත සංදර්ශන, ප්‍රාසංගික වැඩසටහන් පැවැත්වීම හා වාර්ෂික සුහද හමු පැවත්වීම සඳහා උසස් මට්ටමේ සේවා හා පහසුකම් සැපයීම.



## වෙළෙඳ ප්‍රචාරණ හා දැන්වීම්

අලෙවිකරණයට අදාළ නිශ්චල ඡායාරූප ගැනීමට සහ වීඩියෝ පට සඳහා අවශ්‍ය පසුතල ලබාදීම මගින් සේවා පහසුකම් සැපයීම. ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ක්‍රීඩක/ක්‍රීඩිකාවන්ගේ සහභාගිත්වයෙන් වෙළෙඳ දැන්වීම් ක්‍රීඩාංගණ පරිශ්‍රයේ රූගත කිරීම.

සිනමාකරුවන් විසින් ද ඔවුන්ගේ ක්‍රීඩාව සම්බන්ධ නිර්මාණයන්වල දී ක්‍රීඩාංගණ පරිශ්‍රයේ පසුතලය යොදාගැනීමට අවශ්‍ය පහසුකම් ලබාගැනීම සිදු කරයි.

දැන්වීම් පළකිරීම හා ප්‍රචාරන කටයුතු සඳහා ප්‍රධාන මාර්ගයට මුහුණලා සවිකර ඇති ඩිජිටල් තාක්ෂණයෙන් යුත් අඩි 20 x 20 ප්‍රමණයෙන් යුත් LED දැන්වීම් පුවරුවක් එළිමහන් ක්‍රීඩාංගණයේ ස්ථාපනය කර ඇත.



ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ල

ඉහත සේවා සහ පහසුකම් සැපයීම සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පහත අනුබද්ධ ආයතනයවලින් සමන්විත වේ.

- සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය හා පිහිණුම් තටාක සංකීර්ණය
- සුගතදාස ක්‍රීඩා හෝටලය
- සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය
- ආර්.ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය
- බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණය
- බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තටාක
- නුවරඑළිය තුරඟතරග පිටිය

## මානව සම්පත් සංවර්ධනය

2020 මූල්‍ය වර්ෂය තුළ සේවක අභිප්‍රේරණය සහ කුසලතා වර්ධනය කෙරෙහි කාර්යය මණ්ඩලය යෙදවීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ වර්ෂයකි. මෙයට බොහෝ සේ බලපාන ලද හේතුව වූයේ මාර්තු මස සිට ගෝලීය වසංගතයක් වූ කොවිඩ් 19 වෛරස ව්‍යාප්තියයි. මාස කිහිපයක්ම රටතුල නිරෝධායන ඇඳිරිනීතිය පනවා තිබීම හේතුවෙන් කාර්යාල කටයුතු සාමාන්‍ය පරිදි පවත්වා ගෙන යාමට බාධාවිය. මාස කිහිපයක්ම නිවසේ සිට රාජකාරි කටයුතු කිරීමටද සිදුවිය.

එබැවින් සැලසුම් කරන ලද පුහුණු වැඩ සටහන් අවලංගුවූ අතර, වසර අවසානයේ මාර්ගගත (online) වැඩසටහන් පැවැත්වීමට එම ආයතන කටයුතු කරන ලදී. ඒ අනුව පුහුණු වැඩ සටහන් ඉතා අවම මට්ටමක පැවැත්වීමට සිදුවන ලදී

| වැඩසටහන | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | කාලසීමාව | සමස්ථ ආයෝජනය (රු. '000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 01 | 2020.09.24, 25 | 8,500.00 | - | දේශීය |
| කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි | 02 | 2020.02.24, 25 | 8,000.00 | - | දේශීය |
| Building Automation Systems | 01 | 2020.02.09 | 28,000.00 | - | දේශීය |
| ලිපිගොනුකරණය | 50 | 2020.08.14 | 70,000.00 | - | දේශීය |
| කාර්යක්ෂමතා කඩඉම් විභාග | 81 | 2020-08- 18 සිට 2020-12-10 දක්වා | 513,925.00 | - | දේශීය |




**කාර්යය මණ්ඩලය වෙනුවෙන් සුගතදාස ක්‍රීඩා හෝටලයේදී පැවැත්වූ ලිපිගොනුකරණය පුහුණු වැඩසටහන - 2020**

## කළමනාකාරීත්ව වාර්තාකරණය

ආයතනික මාසික ප්‍රගතිය ක්‍රීඩා අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම අඛණ්ඩ ව මාසික ව සිදු කරන අතර, තුන් වන කාර්තුව අවසානයේ පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන කාර්යසාධන වාර්තාව නිසි පරිදි ඉදිරිපත් කිරීමටත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, අයවැය දෙපාර්තමේන්තුව, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව යන ආයතන වෙත සංඛ්‍යාංක දත්ත ඉදිරිපත් කිරීමටත් කටයුතු කර ඇත.

## කළමනාකාරීත්ව මණ්ඩල රැස්වීම් - 2020

මෙම අධිකාරියේ අභිවෘද්ධියට අදාල ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගැනීම කළමනාකාරීත්ව මණ්ඩලය විසින් සිදුකරන අතර, ඊට අදාළ රැස්වීම් මාසිකව පැවැත්වේ. 2020 වර්ෂයට අදාළව පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා කළමනාකාරීත්ව මණ්ඩල රැස්වීම් 07ක් පවත්වා ඇත.

## අධිකාරියේ විගණන කාර්යය

2020 විගණිත වර්ෂය සඳහා විගණන විමසුම් 13ක් ඉදිරිපත් වී ඇති අතර, විගණන කමිටුව එම වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 01ක් පැවැත්වීමට කටයුතු කර ඇත. ඒ අනුව,

- අභ්‍යන්තර විගණන විමසුම් සඳහා 2020 වර්ෂයට අදාළ පිළිතුරු ලබා දී ඇති අතර, ඒවා ක්‍රියාවට ද ලක් කර ඇත.

- ක්‍රීඩා අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 03ක් සඳහා මෙම අධිකාරියේ ඊට අදාළ නිලධාරීන් සහභාගී වී ඇත.

## භාණ්ඩ සමීක්ෂණය - 2020

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2020 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය සඳහා 2019.12.12 දින අනුකමිටු 14කින් සමන්විත භාණ්ඩ සමීක්ෂණ කමිටුව පත් කරන ලදී. රජයේ මුදල් රෙගුලාසි 756, 757 විධිවිධාන අනුව සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත.

## වාර්ෂික ප්‍රසම්පාදනය

2020 මූල්‍ය වර්ෂය තුළ අධිකාරියේ ක්‍රියාකාරකම් උදෙසා ගෘහස්ථ ක්‍රීඩාංගණය, එළිමහන් ක්‍රීඩාංගණය, බෝගම්බර ක්‍රීඩාංගණය හා බෙලිඅත්ත ක්‍රීඩාංගණය මෙන්ම නුවරඑළිය තුරඟ තරඟ ක්‍රීඩාංගණ වෙනුවෙන් සිදුකරන ලද ප්‍රසම්පාදන කටයුතු පහත පරිදි වේ.

| අ.අ | ප්‍රසම්පාදනය | මුදල (රු) |
|---|---|---|
| 1 | සුගතදාස අධිකාරිය සඳහා රිසෝ ග්‍රාෆ් යන්ත්‍රයක් මිලදී ගැනීම | 508,000.00 |
| 2 | සුගතදාස අධිකාරියේ පිහිණුම් තටාක සඳහා අවශ්‍ය 90%ක් ක්ලෝරීන් මිලදී ගැනීම | 1,309,000.00 |
| 3 | සුගතදාස අධිකාරිය සඳහා 2020 වසරට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම | 1,165,127.10 |
| 4 | බෝගම්බර ක්‍රීඩාංගණය සඳහා 2020 වසරට පිරිසිදු කිරීමේ සේවාව ලබා ගැනීම | 4,839,840.00 |
| 5 | සුගතදාස අධිකාරියේ පිහිණුම් තටාක සඳහා 2020 - 2021 වසර සඳහා 70% හා 90%ක් ක්ලෝරීන් මිලදී ගැනීම | 3,144,000.00 |

## සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය

සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය පහත සඳහන් අංගවලින් සමන්විත වේ.

- උප ක්‍රීඩාගාර (බැඩ්මින්ටන්, ස්කොෂ් හා මේස පන්දු)
- පිහිණුම් තටාක සංකීර්ණය
- කායවර්ධන මධ්‍යස්ථානය
- ක්‍රීඩා හෝටලය

## ගෘහස්ථ ක්‍රීඩාගාරය



ගෘහස්ථ ක්‍රීඩාගාරය ආසන 5004කින් සැදුම්ලත් වායුසමීකරණය කළ ප්‍රේක්ෂකාගාරයකින් සමන්විත වන අතර, මෙහි ගෘහස්ථ ක්‍රීඩා පිටියෙහි පළල මීටර් 35ක් හා දිග මීටර් 40ක් වේ. මෙම ක්‍රීඩාගාරයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පැසිපන්දු, බැඩ්මින්ටන්, දැල්පන්දු, ජූඩෝ, ජිම්නාස්ටික්, වොලිබෝල්, මේස පන්දු, බොක්සිං, කරාතේ, මල්ලවපොර ආදී ගෘහස්ථ ක්‍රීඩා තරග පැවැත්වීමට පහසුකම් සැකසී ඇත. මීට අමතරව විවිධ උත්සව, සම්මේලන, සංගීත සංදර්ශන, රාජ්‍ය උත්සව හා වැඩමුළු පැවැත්වීම සඳහා පහසුකම් සපයනු ලැබේ.

2020 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගෘහස්ථ ක්‍රීඩාගාරයේ පවත්වන ක්‍රීඩා තරග හා වෙනත් උත්සවවලින් රු.9,922,127.00 වාර්ෂික ආදායමක් උපදවා ඇත.

2020 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගෘහස්ථ ක්‍රීඩාංගනයේ පැවැති තරඟ ශුරතාවලි සහ වෙනත් උත්සව පිළිබඳ සාරාංශයන් පහත පරිදි වේ.

| අ.අ | ක්‍රියාකාරකම | ජාත්‍යන්තර | ජාතික | එකතුව |
|---|---|---|---|---|
| 01 | කරාතේ තරග | - | 05 | 05 |
| 02 | දැල් පන්දු තරග | - | 01 | 01 |
| 03 | බැඩ්මින්ටන් තරග | - | 01 | 01 |
| 04 | බොක්සින් තරග | - | 01 | 01 |
| 05 | ළමා ක්‍රියාකාරකම් | - | 02 | 02 |
| 06 | සම්මේලන, ත්‍යාග උත්සව | - | 01 | 01 |
| 07 | ධර්ම දේශන | - | 01 | 01 |
| 08 | පුහුණුවීම් | - | 18 | 18 |
| 09 | වීඩියෝ පටිගත කිරීම් | - | 01 | 01 |
| 10 | වෙළෙඳ කුටි | - | 21 | 21 |
| | එකතුව | **-** | **61** | **61** |

## <u>උප ක්‍රීඩාගාරය</u>





මෙම උප ක්‍රීඩාගාර බැඩ්මින්ටන් ක්‍රීඩා පිටි දෙකකින් ස්කොෂ් ක්‍රීඩාගාර හතරකින් සමන්විත වන අතර, ක්‍රීඩා තරග හා පුහුණුවීම් කටයුතු සඳහා පහසුකම් ලබාදීමට සකසා ඇත.

## <u>පිහිණුම් තටාක සංකීර්ණය</u>

ශ්‍රී ලංකාවේ පිහිටි ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සහිත එකම පිහිණුම් තටාක සංකීර්ණය අධිකාරිය සතුවේ. මෙහි ජාතික හා ජාත්‍යන්තර පාසැල් හා ක්‍රීඩා සංගම් මගින් සැලසුම් කරනු ලබන පිහිණුම් පුහුණුවීම් කටයුතු මෙන්ම පිහිණුම් තරගාවලි/සංදර්ශණ වැඩසටහන් පැවැත්වීම සඳහා වෙන්කිරීම් කරනු ලබයි. ඒ අනුව පිහිණුම් තටාක සංකිර්ණයේ රාත්‍රී කාලයේදී පැවැත්වෙන තරඟ සඳහා ආලෝක පහසුකම් ලබාදීම සඳහා අධිබලැති විදුලි ආලෝක කුළුණු සහිත පහසුකම් සැකසී ඇති ශ්‍රී ලංකාවේ එකම පිහිණුම් තටාක සංකිර්ණය ලෙස ද හැදින්විය හැක.

අධිකාරිය විසින් පිහිණුම් පුහුණුකරුවන් යොදවා පාසැල් ළමුන් වෙනුවෙන් ළමුන් බඳවාගෙන පිහිණුම් පුහුණුවීම කටයුතු සඳහා යොමුකිරීමටද දීර්ඝ කාලයක සිට කරගෙන යන බව සඳහන් කළ යුතුය. එම සාමාජිකත්වය මාසිකව/මාස 03/ මාස 06 හා වර්ෂයකට වශයෙන් නිකුත් කිරීම සිදුකරනු ලබයි.

එමෙන්ම ප්‍රෙක්ෂකයින්ගේ පහසුව වෙනුවෙන් මෙම වර්ෂයේදී ප්‍රෙක්ෂකාගාරය ආවරණය වන ලෙස වහළයක් ඉදිකිරීම හා එහි ඇති ෆයිබර් පුටු අළුත්වැඩියා කිරීම සිදුකරන ලදී.



ප්‍රධාන පිහිණුම් තටාකය ( දිග මීටර් 50 / පළල මීටර් 22 / ගැඹුර මීටර් 02 )



පුහුණුවීම් සඳහා උප පිහිණුම් තටාකය



කිමිඳුම් තටාකය



ළමා පිහිණුම් තටාකය

2020 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා පිහිණුම් තටාකවල පැවැති තරග/ ශූරතාවලි/ පුහුණුවීම් සාමාජිකත්ව පිළිබඳ සාරාංශයන් පහත පරිදි වේ.

| | |
|---|---|
| පාසල් ළමුන් සඳහා පිහිණුම් සාමාජිකත්ව | 299 |
| වැඩිහිටියන් සඳහා පිහිණුම් සාමාජිකත්ව | 91 |
| පිහිණුම් කිමිඳුම් හා ජල පන්දු තරග | 05 |
| පුහුණුවීම් | 103 |
| එකතුව | 498 |

ඉහත තරඟ/ ශූරතාවලි/ පුහුණුවීම් සාමාජිකත්ව සැපයීමෙන් පිහිණුම් තටාකාංගනවලින් රු.2,630,078.00 ආදායමක් උපදවා ඇත.

## <u>කායවර්ධන මධ්‍යස්ථානය</u>

මෙම මධ්‍යස්ථානයේ පහසුකම් ලබාගැනීම සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙන්ම සෙසු සේවා ලාභීන්ටද සාමාජිකත්වය ලබාගෙන අවශ්‍ය පුහුණුවීම් වල යෙදිය හැක.

2020 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කායවර්ධන මධ්‍යස්ථානයෙන් රු.1,375,259.00 ආදායමක් උපදවා ඇත.



**ගෘහස්ථ ක්‍රීඩාංගණයේ කායවර්ධන මධ්‍යස්ථානය**

## <u>ක්‍රීඩා හෝටලය</u>



මෙම අධිකාරියේ සේවා පහසුකම් ලබා ගැනීම සඳහා පැමිණෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත නේවාසික පහසුකම් ලබාදීම සඳහා ස්ථාපනය කර ඇති ක්‍රීඩා හෝටලය නවීකරණයෙන් පසු යාවත්කාලීන තොරතුරු පහත පරිදි වේ.



මෙම ක්‍රීඩා හෝටලය සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය යටතේම පරිපාලනය කරනු ලබන අතර, මෙහි නේවාසික පහසුකම් සඳහා වායුසමීකරණය කරන ලද කාමර 42කින් යුක්ත දෙමහල් ගොඩනැගිල්ලක් ලෙස ස්ථාපනය කර ඇත. මෙහි සාමාජික සාමාජිකාවන් 150කට අධික පිරිසකට එකවර නවාතැන් ගැනීමෙහි හැකියාව ඇත. මෙහි නවාතැන් පහසුකම් ලබා ගැනීමට අමතරව උත්සව, ප්‍රියසාද පැවැත්වීම, රැස්වීම් හා වැඩමුළු පැවැත්වීම සඳහා ද පහසුකම් සලසා ඇත.
මෙම හෝටලයේ තවදුරටත් සංවර්ධන කටයුතු වශයෙන් 2020 වසරේදී වායුසමීකරණ පද්ධතිය හා ගිනිනිවීම් උපකරණ පද්ධතිය ස්ථාපනය කර ඇත.

**ගෘහස්ථ ක්‍රීඩාංගණය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය - 2020.12.31 දිනට**

| අ.අ | කාර්යය | ඇස්තමේන්තුගත වටිනාකම (රු මිලි) | 2020 වසර සඳහා (රු මිලි) | | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| | | | ප්‍රතිපාදන | වියදම | |
| 01 | සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේ ප්‍රධාන පිවිසුම් ගේට්ටුව ප්‍රතිසංස්කරණය | | 6.0 | 1.47 | 99% |
| 02 | සුගතදාස ක්‍රීඩා හෝටලයේ වායුසමීකරණ පද්ධතිය ස්ථාපනය කිරීම | | 4.0 | 2.49 | 99% |
| 03 | සුගතදාස ක්‍රීඩා හෝටලයේ ගිනි නිවීමේ පද්ධතිය ස්ථාපනය කිරීම | | 8.0 | 0.65 | 99% |
| 04 | ගෘහස්ථ ක්‍රීඩාංගණයේ තීන්ත ආලේපය සහ ප්‍රතිසංස්කරණය | | 17.0 | 9.90 | 99% |
| 05 | සුගතදාස පිහිණුම් තටාකාංගනයේ මණ්ඩල වහලය සවිකිරීම හා ෆයිබර් පුවු අලුත්වැඩියා කිරීම | | 26.0 | 13.27 | 95% |
| 06 | ගෘහස්ථ ක්‍රීඩාංගණයේ පිහිණුම් තටාක පරිශ්‍රයේ ඇඳුම් මාරු කිරීමේ කාමර හා වැසිකිලි පද්ධතිය අලුත්වැඩියා කිරීම. | | 41.0 | 4.96 | 75% |
| 07 | ගෘහස්ථ ක්‍රීඩාංගණයේ උප ක්‍රීඩාංගණයෙහි දැවමය බිම ප්‍රතිසංස්කරණය | | 17.0 | 9.80 | 90% |

**ගෘහස්ථ ක්‍රීඩාංගණයේ 2021 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති**

| අ.අ | කාර්යය | අයවැය ප්‍රතිපාදන (රු මිලි) |
|---|---|---|
| 1 | පිහිණුම් තටාක සංකීර්ණයේ පොම්පාගාරය නවීකරණය කිරීම | 78.0 |
| 2 | පිහිණුම් තටාක සංකීර්ණයේ විද්‍යුත් කාලගණක යන්ත්‍ර සවිකිරීම | 78.0 |
| 3 | පිහිණුම් තටාකයේ එළිමහන් ආසන නඩත්තු කිරීම | 28.0 |

## සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය

ශ්‍රී ලාංකික පාසැල් කිඩක කීඩිකාවන් වෙනුවෙන් මලල ක්‍රීඩා තරග පැවැත්වීමට ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් වලින් සැකසී ඇති එකම ක්‍රීඩාංගණය වේ. දිවා සහ රාත්‍රී කාලවලදී ජවන හා පිටිය ක්‍රීඩා තරග හා පාපන්දු/රග්බි පුහුණුවීම් හා තරග එකවර පැවැත්වීමට හැකි ආකාරයට මෙම ක්‍රීඩාංගණය සකසා ඇත. මෙම ක්‍රීඩාංගණයේ එකවර ප්‍රේක්ෂකයින් 20,000 කට පමණ තරග නැරඹිය හැකි ආකාරයට ක්‍රීඩාගාර පහසුකම් සැකසී ඇත.



එළිමහන් ක්‍රීඩාංගණයේ මීටර් 400 හා මීටර් 200 වශයෙන් කෘත්‍රිම ධාවන පථ 02ක් ඇත. මෙම කෘතීම ධාවන පථ වල පස්වන වතාවට නවීකරණ කටයුතු මෙම වර්ෂයේදී අවසන් කරන ලදී. මීට අමතරව මහල් තුනකින් යුත් මාධ්‍ය කුටියක්, අධිබලැති විදුලි ආලෝක පද්ධතියක් මඟින් රාත්‍රී ක්‍රීඩා තරග පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සපයා ඇත. මෙම ක්‍රීඩා පිටියේ මළල ක්‍රීඩා, වොලිබෝල්, රගර්, පාපන්දු, පැසිපන්දු ක්‍රීඩා මෙන්ම විවිධ උත්සව සඳහාද පහසුකම් සපයනු ලැබේ.

2020 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගණයේ පැවැත්වූ තරග හා උත්සව පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අ.අ | ක්‍රියාකාරකම | ජාතික | ජාත්‍යන්තර | එකතුව |
|---|---|---|---|---|
| 01 | පාපන්දු තරග | 29 | - | 29 |
| 02 | ක්‍රීඩා උත්සව (මීටර් 400 ධාවන පථය) | 27 | - | 27 |
| | ක්‍රීඩා උත්සව (මීටර් 200 ධාවන පථය) | 26 | - | 26 |
| 03 | මළල ක්‍රීඩා තරග | 05 | - | 05 |
| 04 | වීඩියෝ පටිගත කිරීම් | 03 | - | 03 |
| 05 | පුහුණුවීම්/තේරීම් තරඟ/පෙරපුහුණු | 24 | - | 24 |
| 06 | ව්‍යායාම සඳහා ඇවිදීමේ සාමාජිකත්ව | 42 | - | 42 |
| 07 | දැල් පන්දු පුහුණුවීම් | 99 | - | 99 |
| 08 | වෙරළ අත්පන්දු තරග | 02 | - | 02 |
| 09 | වෙනත් | 03 | - | 03 |
| | **එකතුව** | **260** | **-** | **260** |

2020 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ පැවැත් වූ තරග, උත්සව, ඕ රථගාල, බදු කුලී හා වෙනත් ප්‍රභවයන් මඟින් රු.21,462,175.00 ආදායමක් උපදවා ඇත.

**2020.12.31 දිනට එළිමහන් ක්‍රීඩාංගණය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| | කාර්යය | ඇස්තමේන්තුගත වටිනාකම (රු මිලි) | 2020 වසර සඳහා (රු මිලි) | | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| | | | ප්‍රතිපාදන | වියදම | |
| 01 | සභාපති බංගලාව ප්‍රතිසංස්කරණය - අවසන් අදියර | | 16.0 | 4.38 | 98% |
| 02 | මීටර් 200 එළිමහන් ක්‍රීඩාංගනයේ ක්‍රීඩා මණ්ඩපය ප්‍රතිසංස්කරණය | | 11.0 | | 99% |
| 03 | ඕ රථගාල අලුත්වැඩියා කිරීම - ඉතිරි වැඩ | | 14.5 | 5.23 | 95% |
| 04 | එළිමහන් ක්‍රීඩාංගනයේ මායිම් වැට ජාත්‍යන්තර ක්‍රීඩාංගණ ප්‍රමිතියට අනුව ප්‍රතිසංස්කරණය කිරීම. | | | | |
| | (a) එළිමහන් ක්‍රීඩාංගනයේ මායිම් වැට ඉදිකිරීම | | 18.0 | 5.29 | 88% |
| | (b) එළිමහන් ක්‍රීඩාංගනයේ වානේ වැට, ප්‍රධාන පිවිසුම සහ අවට ඉදිකිරීම | | 64.0 | 14.9 | 65% |
| | (c) එළිමහන් ක්‍රීඩාංගනයේ මායිම් වැට ඉදිකිරීම | | 54.0 | 5.0 | 45% |
| 05 | සේවක නිවස්නය ඉදිකිරීම - දෙවන අදියර | | 22.5 | 5.31 | 96% |

**සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ 2021 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති**

| අ.අ | කාර්යය | අයවැය ප්‍රතිපාදන (රු.මිලි) |
|---|---|---|
| 1 | එළිමහන් ක්‍රීඩාංගණයේ ධාවන පථ සඳහා කාලගණක යන්ත්‍ර මිලදී ගැනීම, සවිකිරීම හා පවත්වාගෙන යාම | 186.0 |
| 2 | ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම | 68.0 |
| 3 | මීටර් 400 කෘත්‍රිම ධාවන පථයේ නඩත්තු කටයුතු | 20.0 |
| 4 | පතිත ආලෝක පද්ධතිය සවිකිරීම | 30.0 |
| 5 | එළිමහන් ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතු | 20.0 |

## අනුබද්ධ ආයතන හා ක්‍රීඩාංගණ පරිශ්‍ර

### බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණය



මෙම ක්‍රීඩාංගණය මහනුවර නගර සභාව විසින් පාලනය කරන ලද අතර, 2001 වසරේ සිට මෙම අධිකාරිය වෙත භෞතික අයිති පැවරීමෙන් පසු පරිපාලන කටයුතු සිදු කරනු ලැබේ. මේ සඳහා ක්‍රීඩාංගණ කළමනාකරු ඇතුළු කාර්ය මණ්ඩලය 70 කට අධික පිරිසක් සේවයේ යොදවා ඇත.



මෙම එළිමහන් ක්‍රීඩාංගණය තුළ එකවර ප්‍රේක්ෂකයින් 10,000කට පමණ තරග නැරඹිය හැකි ආකාරයේ ක්‍රීඩාගාර පහසුකම් ඇත. මෙහි මලල ක්‍රීඩා, පාපන්දු, රගර්, වොලිබෝල්, දැල්පන්දු, පාසැල් ක්‍රීඩා උත්සව හා වෙනත් උත්සව සඳහා පහසුකම් ඇත.

මෙම ක්‍රීඩාංගණය සඳහා නව කායවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකර ඒ සඳහා නවීන කායවර්ධන උපකරණ ද මිලදී ගෙන ඇති අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙන් ම සේවා ලාභීන්ට මෙහි සාමාජිකත්වය ලබාගෙන අවශ්‍ය පහසුකම් ලබාගැනීමේ පහසුකම් සලසා ඇත.

2020 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගනයේ රථ ගාලෙන්, කායවර්ධන මධ්‍යස්ථානය මඟින් හා වෙනත් ලැබීම්වලින් රු.6,466,002.00ක ආදායමක් උපදවා ඇත.

### බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය - 2020.12.31 දිනය

| | කාර්යය | ඇස්තමේන්තුගත වටිනාකම (රු මිලි) | 2020 වසර සඳහා (රු මිලි) | | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| | | | ප්‍රතිපාදන | වියදම | |
| 01 | බෝගම්බර ක්‍රීඩාංගනයේ ප්‍රධාන පිවිසුම් දොරටුව ඉදිකිරීම - අදියර 2 | | 6.0 | 1 | 99% |
| 02 | මීටර් 400 ධාවන පථය ඇතිරීම | ටෙන්ඩර් ලේඛන සකස් කරමින් පවතී | | | |
| 03 | පාපන්දු ක්‍රීඩාංගනය ප්‍රතිසංස්කරණය කිරීම | | 22.0 | 13.96 | 99% |

## බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණයේ 2021 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති

| අ.අ | කාර්යය | අයවැය ප්‍රතිපාදන (රු.මිලි) |
|---|---|---|
| **02** | මීටර් 400 ධාවන පථය ඇතිරීම | 200.0 |




**බෝගම්බර කායවර්ධන මධ්‍යස්ථානය**

## නුවරඑළිය තුරඟතරග පිටිය

2011-09-07 දින ක්‍රීඩා අමාත්‍යාංශය විසින් නුවරඑළිය තුරඟතරඟ පිටියේ කළමනාකාරීත්වය සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට පවරන ලදී.




**තුරඟ තරග අවස්ථාවක් - නුවරඑළිය තුරඟ තරග පිටිය**



භූමි ප්‍රමාණය හෙක්ටයාර 34,564ක් වූ මෙම තුරඟතරඟ පිටියෙන් 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අශ්වගාල්වලින්, බදුකුළී, අශ්ව/පෝනි ඇවිදීම වෙනුවෙන් ලද ආදායම, භූමිය කුළී පදනම මත ලබා දීම හා රථ වාහන නවතා තැබීමෙන් ලද ආදායම ලෙස රු.2,390,042.00ක් උපයා ගෙන ඇත.

වාර්ෂිකව පවත්වනු ලබන වසන්ත සැණකෙලිය රටතුල මාර්තු මස සිට පැතිර ගියකොවිඩ් 19 වෛරස ව්‍යාප්තිය හේතුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද සෞඛ්‍ය නීතිරීති වලට අනුව මෙම වර්ෂයේ සංවිධානය නොකරන ලදී. එමගින් අධිකාරියට වාර්ෂිකව හිමිවිය යුතු සැලකිය යුතු ආදායමක් අහිමිවන ලදී.

## බෙලිඅත්ත පිහිණුම් තටාක සංකීර්ණය

මෙම පිහිණුම් තටාක සංකීර්ණය පහත අංගවලින් සමන්විත වේ.

- මංතීරු 08ක් සහිත මීටර් 50ක් දිගැති පිහිණුම් තටාකය
- කිමිදුම් තටාකය



බෙලිඅත්ත කාර්මික විදුහලේ පිහිණුම් තටාකවල පරිපාලනය හා නඩත්තු කටයුතු පමණක් 2008-08-07 දින සිට සුගතදාස අධිකාරිය විසින් සිදු කරනු ලැබුවත් මෙම පිහිණුම් තටාකවල අයිතිය සුගතදාස අධිකාරිය සතු නොවේ. අවට ප්‍රදේශවල වැඩිහිටියන් හා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට පිහිණුම් කටයුතු සඳහා පහසුකම් සැපයීම සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය විසින් සිදු කරනු ලබයි.



මෙම පිහිණුම් තටාකවල 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මුළු ආදායම රු.446,770.00 වේ. මෙම පිහිණුම් තටාක දෙක පිළිබඳව වැඩිහිටියන්, පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ ක්‍රීඩා සමාජ දැනුවත් කළද සහභාගීත්වය ඉතාමත් අඩු බැවින් ඉහළ ආදායමක් අපේක්ෂා කළ නොහැක.

## ආර් ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය



ආර්.ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගණය අප රට සතු ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රිකට් තරඟ පැවැත්වීමට අවැසි සියලු පහසුකම්වලින් සමන්විත එක් ක්‍රීඩාංගනයකි. මෙහි එකවර ප්‍රේක්ෂකයින් 35,000කට පමණ තරඟ නැරඹීමේ පහසුකම් ඇති අතර, විශාල රථ ගාලකින්ද යුක්ත වේ. මෙම ක්‍රීඩාංගනය 2006-05-10 දින ගනු ලැබූ කැබිනට් මණ්ඩල තීරණයක් අනුව 2006-11-01 දින සිට වසර තිහක කාලයක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට මසකට රු. 250,000/- ක මුදලකට බදු දී ඇත. ඒ අනුව, 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගනය මගින් රු. 2,750,000.00ක ආදායමක් උපදවා ඇත.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ප්‍රධානතම ආදායම් මාර්ගයක් ව පැවැති මෙම ක්‍රීඩාංගනය දීර්ඝ කාලීනව මාසික නොවෙනස් බදු කුලියක් සහිතව බදුදීම මෙම අධිකාරියේ ආදායම පහත වැටීමට බලපා ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. පොදු කරුණු

1.1 අනුකූලතා ප්‍රකාශනය
සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රාජ්‍ය අංශය පිළිබඳ වූ ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලය.

1.2 සකස් කිරීමේ පදනම
ගිණුම් සම්බන්ධ සටහනේ පැහැදිලි කර ඇති පරිදි, මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇත්තේ ඉඩම්, යන්ත්‍රෝපකරණ සහ ගොඩනැගිලි ප්‍රතිප්‍රමාණය සඳහා ගලපන ලද ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය උපයෝගී කරගෙනය. සුදුසු තැන්හී මෙම ප්‍රතිපත්ති පසුව එන සටහන් මගින් පැහැදිලි කර ඇත.

1.3 ශේෂ පත්‍රයේ දිනයට පසු හටගත් සිදුවීම්
ශේෂ පත්‍රයේ දිනයට පසුව හටගත් සියලු සැලකිය යුතු සිදුවීම් සැලකිල්ලට ගෙන අවශ්‍ය තැන්හී මූල්‍ය ප්‍රකාශනයේ ගැලපීම් හා අනාවරණයන් සිදුකර තිබේ.

2. වත්කම් සහ ඒවා අගේ කිරීමේ පදනම
ගෙවීම් ශේෂයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ මුදල් සහ බැංකු ශේෂයන් සහ සාමාන්‍ය ක්‍රියාකාරී චක්‍රය තුළ හෝ ගෙවීම් ශේෂයේ දිනයේ සිට වසරක් තුළ (මින් වඩා කෙටි කාලය තුළ) මුදල් ලෙස ලැබෙන දේය.

2.1 අයිතිය තිබෙන වත්කම්
දේපල සහ යන්ත්‍රෝපකරණ දැක්වෙන්නේ සමුච්චිත ක්ෂය කිරීම්වලට පසුවය. තමන්ම ගොඩනගන ලද වත්කම්වල පිරිවැයට ද්‍රව්‍ය සහ ශ්‍රමය ඇතුළත් ය. දේපල යන්ත්‍රෝපරකණවල වෙනස ප්‍රයෝජනවත් වයස් සීමා ඇති දේ අඩංගුවන විට ඒවා වෙන් වෙන් වශයෙන් ගිණුම්ගතකර තිබේ.

නුවරඑළිය ඉඩම් සහ ගොඩනැගිලි
2008.02.02 දක්වා අධිකාරිය මගින් පාලනය කෙරුණු නුවරඑළිය පිට්ටනිය සහ බංගලාව, ක්‍රීඩා අමාත්‍යාංශයේ උපදෙස් පරිදි 2008.02.02 වැනි දින ක්‍රීඩා අමාත්‍යාංශයට භාරදෙන ලදී. 2011 අගෝස්තු 23 දින සිට නුවරඑළිය තුරඟ තරඟ පිටියේ කළමනාකාරිත්වය අධිකාරිය වෙත පවරා තිබේ.

ආර්. ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය
2006.11.01 දින ආර්. ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ කළමනාකරණය, මාසික රු. 250 000 බදු කුලියකට යටත්ව ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත වසර 30කට බදු දෙන ලදී. කෙසේ වුව ද, 2006.12.31 දින ගෙවීම් ශේෂය අනුව, කළමනාකරණය භාර ගැනීමට පෙර ශ්‍රී ලංකා ක්‍රිකට්, ක්‍රිකට් ඇකඩමිය සඳහා රු. 25 753 844.64 ගෙවීමට ඇතිබව දැක්වේ. කෙසේ වුව ද, මෙම මුදල් ප්‍රමාණය සහ අනාගත බදු කුලිය පිළිබඳ නැවත සාකච්ඡා කළ යුතුව ඇත.

බෙලිඅත්ත සහ වීරකැටිය පිහිණුම් තටාක සංකීර්ණ
බෙලිඅත්ත කාර්මික විද්‍යාලයීය පිහිණුම් තටාකය සහ වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලයීය පිහිණුම් තටාකය නඩත්තු කටයුතු සඳහා පමණක් 2008 අගෝස්තු 07 වැනි දින අධිකාරියට භාරදෙන ලදී. 2008 දී මෙම පිහිණුම් තටාක සඳහා වූ වියදම් සුගතදාස අභ්‍යන්තර ක්‍රීඩාංගනයේ වියදම්වල ඇතුළත් කර තිබේ. 2009 දී මෙම පිහිණුම් තටාක සඳහා වියදම් වෙන් වෙන්ව

ගිණුම්ගත කිරීම පාලන මණ්ඩලය අනුමත කර ඇත. මෙම වත්කම් මෙතෙක් නිල වශයෙන් භාර දී නොමැත.

## 2.2 පසුව කෙරුණ වියදම්

දේපල යන්ත්‍රෝපකරණයන්හී අඩංගු යම් කොටසක් නැවත ස්ථාපනය කිරීම සඳහාවන වියදම වෙනම ගිණුම්ගත කළ විට, එම වියදම ප්‍රාග්ධනායික කෙරේ. එම කොටසේ යම් වටිනාකමක් ඉතිරිව ඇත්නම්, එය ගිණුම් පොතෙන් ඉවත් කෙරේ. වෙනත්, පසුව කෙරෙන වියදම් ප්‍රාග්ධනායික කෙරෙනුයේ එම වියදම් යටකී වත්කම්වල අන්තර්ගත ආර්ථික වාසි වර්ධනය කරනවා නම් පමණි. වෙනත් සියලු වියදම්, ආදායම් ප්‍රකාශනයේ සලකනු ලබන්නේ දරණ ලද වියදම් ලෙස ය.

## 2.3 ක්ෂය කිරීම

ක්ෂය කිරීම, යන්ත්‍රෝපකරණයන්හී සඵල ජීවිත කාලය තුළ ආවරණයවන පරිදි, සරල මාර්ග ක්‍රමය අනුව ආදායම් ප්‍රකාශනයට අය කෙරේ. ඉඩම් පිළිබඳව ක්ෂය කිරීමක් සිදු නොකෙරේ. මිලට ගනු ලැබූ වසර සඳහා පූර්ණ වසර ක්ෂය කිරීමක් කෙරෙන අතර, වත්කම ඉවත් කෙරුණ වසර සඳහා ක්ෂය කිරීමක් නොකෙරේ.

ආලෝක බල්බ සහ දල්වනයන් පුනරාවර්තන ගිණුමෙන් ප්‍රාග්ධන වත්කම් ලෙස මාරු කිරීම කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. ආලෝක බල්බ සඳහා ක්ෂය කිරීම 50% සිට 33.3% දක්වා අඩු කිරීම කළමනාකරණ මණ්ඩලය අනුමත කර ඇත. ක්ෂය කිරීමේ ප්‍රතිශතය

| | |
|---|---|
| තනි අයිතිය ඇති ගොඩනැගිලි | 2.3% |
| ආලෝක කණු | 10% |
| කෘතිම ධාවන පථය | 20% |
| යන්ත්‍රෝපකරණ | 10% |
| මෝටර් රථ | 20% |
| ක්‍රීඩා උපකරණ | 10% |
| ගෘහ භාණ්ඩ | 10% |
| කාර්යාලයීය උපකරණ | 10% |
| පරිගණකය | 25% |
| රෙදිපිළි | 50% |
| ආලෝක බල්බ සහ දල්වනයන් | 33.3% |

රු. 7 500 000 වටිනා අංක NB-1527 දරණ නව වෑන් රථය මෙම වසරේ දී, අයවැය චක්‍රලේඛන 150 ප්‍රකාර මහා භාණ්ඩාගාරය මගින් මෙම අධිකාරියට ලබාදෙන ලදී. වාහනවල වටිනාකම අධිකාරියේ ගිණුම්වල ඇතුළත් කර ඇත්තේ ඒවාට අදාළ රක්ෂණ වටිනාකම අනුව ය.

රු. 210 267.86 වටිනා BBG-3006 නව යතුරු පැදියක්, අයවැය චක්‍රලේඛන අංක 150 ප්‍රකාර, මහා භාණ්ඩාගාරයෙන් මෙම අධිකාරියට මෙම වසරේ ලබාදී තිබේ.

## 2.4 බඩු ලේඛන

බඩු ලේඛනගත කර ඇත්තේ පිරිවැය අනුව ය. පොදුවේ ගත්කල පිරිවැය 'පෙරඇතුළු පෙරපිට' පදනමට අගය කර ඇත. මිලදී ගැනීම හා සම්බන්ධ සියලු වියදම් සහ ස්ථානගත කිරීමේ වියදම් ද, ඇතුළත් ය. අවශ්‍ය පරිදි බඩු ලේඛනයේ ඇති යල්පැනපු දේ පිළිබඳව වෙන් කිරීම් කර ඇත. අභ්‍යන්තර සහ බාහිර ගබඩා එක් ප්‍රධාන ගබඩාවක් ලෙස ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

## 2.6 ආර්. ප්‍රේමදාස ක්‍රිකට් සංකීර්ණයේ තොග

මෙම ආයතනයේ බඩු ලේඛනයෙන් රු. 2 149 491 වටිනා තොග ඉවත් කිරීමට තීරණය කර තිබේ. මෙම තොග දීර්ඝ කාලයක් තිබී ඇත. සිදුවූ පාඩුව අදාළ සමාගමෙන් අයකර ගනු ඇත.

## 3. වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සියලුම හඳුනාගත් වගකීම් ගිණුම්ගත කර තිබේ. ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ, ඉල්ලූ විට ගෙවිය යුතුවන වගකීම් හෝ ශේෂ පත්‍ර දින සිට වසරක් තුළ ගෙවිය යුතු වගකීම් ය. ජංගම නොවන වගකීම් නම් ගිණුම් ශේෂ දින සිට වසරකට පසු පියවිය යුතු වගකීම් ය.

### 3.1 සේවක ප්‍රතිලාභ

සේවක අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදල වැනි දායක ක්‍රමයන් ය. මෙම අරමුදල්වලට කෙරෙන දායක, ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස පිළිගැනේ.

### 3.2 වෙළෙඳ සහ වෙනත් ගෙවීම්

මේවා පිරිවැය ප්‍රමාණයන් අනුව දැක්වේ.

### 3.3 විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්

සියලුම සේවකයින්ට තම සේවයේ පළමු, වසරේ සිට පාරිතෝෂික ගෙවීමට ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වුව ද, 1983 අංක 13 දරණ පාරිතෝෂික පණත ප්‍රකාර සේවකයෙකු පිළිබඳව වගකීමක් ඇති වන්නේ වසර 05ක අඛණ්ඩ සේවයකට පසුවය.

## 4. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

### 4.1 ආදායම

ආදායම ප්‍රධාන වශයෙන් උපචිත පදනමක් මත දැක්වේ. එනම් සේවය සැපයීම සහ නිම කිරීම අනුව ය.

### 4.2 වියදම්

ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන, අධිකාරිය බදු අය කිරීමට ප්‍රථමයෙන් උපයාගත් ලාභය හෝ දැරූ පාඩුව, සියලු හඳුනාගත් වගකීම් සඳහා ප්‍රතිපාදන සැලසූ පසු වර්ෂයේ ලාභය ගණනය කිරීමේ ව්‍යාපාරය පවත්වාගෙන යෑම සඳහා සියලු වියදම් සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම මට්ටමක තබා ගැනීමට දැරූ වියදම් ආදායමට අයකර තිබේ.

දේපල යන්ත්‍රෝපකරණ ඉවත් කිරීමේ දී ඇතිවන ලාභ සහ අලාභ ආදායම් ප්‍රකාශනයෙන් පෙන්නුම් කෙරේ. කාර්යමණ්ඩලයෙන් අයකරගත් බදු කුලී, විදුලි, ජල සහ දුරකථන ගාස්තු අදාළ වියදම් තීරුවල දක්වා ඇත.

### 4.3 මූල්‍ය ප්‍රතිපාදන පිරිවැය

ස්ථාවර තැන්පතුවලින් ලැබෙන පොලී, ලැබෙන පරිදි ආදායම් ප්‍රකාශනයේ සටහන් වේ. ණය ලබාගැනීමේ දී ගෙවන පොලිය සහ වෙනත් පිරිවැය, මූල්‍ය සම්පාදන පිරිවැයට ඇතුළත්වන වියදම් ය.

### 4.4 ප්‍රදානයන්

ආශ්‍රිත පිරිවැය පියවීම සඳහා අපේක්ෂිත දීමනා සහ සහනාධාර ගැලපීමට අවශ්‍යවන කාලච්ඡේද තුළ ක්‍රමානුකූල පදනමක් මත ආදායම් ප්‍රකාශනයට බැරකර ඇත. වත්කම් හා සම්බන්ධ මූල්‍ය නොවන දීමනා ද, ඇතුළත් දීමනා, සාධාරණ වටිනාකමකට, ශේෂ පත්‍රයේ විලම්භිත ගෙවීම් ලෙස සලකා, අදාළ වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය තුළ ආදායම් ප්‍රකාශනයට බැරකර තිබේ.

**5. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

**මුදල් සහ මුදල් සමාන**

මුදල් සහ මුදල් සමානයන් නිර්වචනය කර ඇත්තේ අත්පිට මුදල් සහ බැංකුගත තැන්පතු ය. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනියම් ක්‍රමය පදනම්ව ඇත.

**6. ශෙවීම් ශේෂ දිනට පසුව සිදුවීම්**

සියලු වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන, සුදුසු තන්හී ගිණුම්වලට අදාළ සටහන්වල ගැලපීම් සහ අනාවරණයන් සිදුකර තිබේ.

**7. අනිස්චිත වගකීම්**

උසාවිවල පවත්වාගෙන යන නඩු කිහිපයක් වෙති.

නුගේගොඩ දිසා අධිකරණයේ අංක 2184/එම්/2015 දරණ නඩුව.

2013 වර්ෂයේ දී සුගතදාස අධිකාරියේ හිටපු සභාපති බ්‍රිගේඩියර් විමල් සමරතුංග, අධිකාරියට අයත් නිල රථයක් ධාවනය කරමින් සිටිය දී අනතුරකට භාජනය වී එහි ප්‍රතිඵලයක් ලෙස ෂයාන් විශාකා ලියනගේ නමැති ළමයෙන් මියගොස් ඇත. ඇයගේ දෙමාපියන් වගඋත්තර කරුවන්ගෙන් වන්දියක් ඉල්ලා නඩුවක් පවරා තිබේ. බ්‍රිගේඩියර් විමල් සමරතුංග සහ සුගතදාස අධිකාරිය පළමුවන සහ දෙවැනි වගඋත්තර කරුවන් ලෙස නම්කර තිබේ. පැමිණිලිකරුවෝ වගඋත්තර කරුවන්ගෙන්, සංධීය හා කතිපය වශයෙන් රු. 50 000 000ක හානි වන්දියක් ඉල්ලා සිටිති.

## මූල්‍ය ප්‍රකාශ

## ආදායම් වියදම් ප්‍රකාශය - 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| අයවැය (වර්තමාන වර්ෂය) | | 2020.12.31 | 2019.12.31 |
|---|---|---|---|
| 163,920,000.00 | මෙහෙයුම් අදායම | 49,973,357 | 146,201,789 |
| | මෙහෙයුම්නොවන අදායම | 892,396 | 22,842,537 |
| **163,920,000.00** | | **50,865,753** | **169,044,326** |
| | | | |
| **319,000,000.00** | රජයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන | **257,820,000** | **234,150,000** |
| | | | |
| **482,920,000.00** | මුළු ආදායම | **308,685,753** | **403,194,326** |
| | | | |
| | **වියදම්** | | |
| | **මෙහෙයුම් වියදම්** | | |
| **256,480,000.00** | සේවක වේතන වියදම් | 186,553,786 | 191,059,601 |
| **-** | කළමනාකාරීත්ව මණ්ඩලයේ දීමනා හා වියදම් | 247,500 | 322,500 |
| **-** | පාරිතෝෂික වෙන්කිරීම් | 3,464,795 | 13,402,966 |
| **-** | ක්ෂයවීම් | 117,374,703 | 134,951,324 |
| **62,520,000.00** | අනෙකුත් වියදම් | 81,222,295 | 124,340,537 |
| **319,000,000.00** | | **389,463,078** | **464,076,928** |
| | | | |
| **163,920,000.00** | මෙහෙයුම් අතිරික්තය (හිඟය) | **-80,777,325** | **-60,882,601** |
| | | | |
| | මූල්‍ය වියදම් | -90,225 | -6,752,139 |
| **163,920,000.00** | බදු පෙර අතිරික්තය (හිඟය) | **-80,867,550** | **-67,634,741** |
| | | | |
| | **එකතුකළා ( මෙහෙයුම් නොවන ආදායම්** | | |
| **-** | ස්ථාවර තැන්පතු පොලී ආදායම | 4,233,581 | 4,448,709 |
| | **පෙර බදු ශුද්ධ අතිරික්තය (හිඟය)** | **-76,633,969** | **-63,186,032** |
| | | | |
| | ආදායම් බදු | -330,219.00 | -346,999.00 |
| | | | |
| | **වර්ෂයේ අතිරික්තය (හිඟය)** | **-76,964,188** | **-63,533,031** |

**<u>ශේෂ පත්‍රය - 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා</u>**

| | 2020.12.31 (රුපියල්) | 2019.12.31 (රුපියල්) |
|---|---|---|
| **ජංගම වත්කම්** | | |
| මුදල් හා බැංකු ශේෂය | 99,890,505 | 16,880,838 |
| ණයගැතියෝ | 25,222,264 | 25,332,980 |
| තොගය | 10,578,505 | 13,125,629 |
| කාර්යය මණ්ඩලයේ දසමස ණය ලබාදීම | 27,477,246 | 30,660,710 |
| අනෙකුත් ලැබිය යුතු ශේෂය | 32,994,623 | 105,601,374 |
| පාරිතෝෂික අරමුදල | 5,322,801 | 5,134,376 |
| ස්ථාවර තැන්පතු | 45,718,331 | 41,317,356 |
| | **247,204,276** | **238,053,261** |
| | | |
| **ස්ථාවර වත්කම්** | | |
| ඉඩම් | 2,856,612,140 | 2,856,612,140 |
| ගොඩනැගිලි | 2,141,979,790 | 2,029,654,365 |
| අධිබලැති විදුලි කුළුනු | - | - |
| අධිබලැති විදුලි බල්බ | 112,457.00 | 195,688 |
| යන්ත්‍ර සහ උපකරණ | 52,311,425 | 62,929,431 |
| පරිගණක | 739,775 | 2,954,161 |
| මෝටර් රථ | 5,584,203 | 7,437,253 |
| ක්‍රීඩා උපකරණ | 52,886,409 | 43,217,334 |
| ලීබඩු සහ උපකරණ | 52,579,222 | 59,890,940 |
| කාර්යාලීය සහ අනෙකුත් උපකරණ | 8,018,621 | 8,811,022 |
| තිරරෙදි | 0 | 50,500.00 |
| සිදුකෙරෙමින් පවතින වැඩ | 302,140,214 | 308,889,579 |
| | **5,472,964,256** | **5,380,642,414** |
| | | |
| **සමස්ථ වත්කම්** | **5,720,168,533** | **5,618,695,675** |
| | | |
| **ප්‍රාග්ධන ස්කන්ධය සහ වගකීම් - ජංගම වත්කම්** | | |
| වෙළඳ ණය හිමියෝ | 2,445,002 | 2,305,259 |
| ආරක්ෂිත තැන්පතු | 16,675,900 | 20,943,123 |
| කලින් ලද ආදායම | 250,000 | 270,000 |
| බදු වෙන්කිරීම් | 2,240,407 | 1,910,188 |
| උපචිත වියදම් හා අනෙකුත් ගෙවිය යුතු වියදම් | 18,014,528 | 13,600,147 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 160,333,807 | 218,573,251 |
| | **199,959,645** | **257,601,968** |
| **ජංගම නොවන වත්කම්** | | |
| පාරිතෝෂික දීමනා | 82,147,340 | 82,147,340 |
| | **82,147,340** | **82,147,340** |

| | | |
|---|---|---|
| **සමස්ථ වගකීම්** | **282,106,985** | **339,749,308** |
| **ශුද්ධ වත්කම්** | **5,438,061,548** | **5,278,946,367** |
| **ශුද්ධ වත්කම් / ප්‍රාග්ධන ස්කන්ධ** | | |
| රජයේ ප්‍රධාන | 7,346,762,609 | 7,104,462,609 |
| සමුච්චිත අරමුදල | -1,841,071,525 | -1,771,317,864 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 9,334,652 | 9,334,652 |
| වර්ෂයේ අතිරික්තය /ඌනතාවය | -76,964,188 | -63,533,031 |
| **මුළු ප්‍රාග්ධන ස්කන්ධ හා වගකීම්** | **5,438,061,548** | **5,278,946,367** |

## අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය - 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2020.12.31 (රුපියල්) | 2019.12.31 (රුපියල්) |
|---|---|---|
| **මෙහෙයුම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| **බදු පෙර අතිරික්තය හෝ ශුද්ධ ඌනතාවය** | **-76,964,188** | **-63,533,031** |
| | | |
| සමුච්චිත අරමුදලට පසුගිය වසරවල කරන ලද ක්ෂය ගැලපීම් | - | - |
| ක්ෂය ගැලපීම් | 117,974,703 | 134,951,324 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 3,464,795 | 13,402,966 |
| (වැඩිවීම්)/අඩුවීම් තොග | 2,547,124 | -2,848,876 |
| (වැඩිවීම්)/අඩුවීම් ලැබිය යුතු ශේෂ | 70,320,391 | -12,036,769 |
| (වැඩිවීම්)/අඩුවීම් ගෙවිය යුතු ශේෂ | -56,893,632 | 127,942,483 |
| පාරිතෝෂික දීමනා වෙනත් | -3,464,795 | -2,399,770 |
| **මෙහෙයුම් වලින් ලද ශුද්ධ මුදල් ශේෂය** | **56,984,397** | **195,478,326** |
| | | |
| **ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| දේපල පිරියත සහ යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම | -211,873,754 | -439,604,638 |
| බදුගෙවීම | - | - |
| ස්ථාවර තැන්පතු වල ආයෝජනය | -4,400,975 | -918,767 |
| REPO ආයෝජනය | - | - |
| **ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය** | **-216,274,729** | **-440,523,405** |
| මූල්‍ය **කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| පෙර වර්ෂයේ ගැලපුම | - | 10,448,714 |

| | | |
|---|---|---|
| රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | 242,300,000 | 143,000,000 |
| මූල්‍ය කටයුතු වලින් ලද මුදල් ශේෂය | **242,300,000** | **153,448,714** |
| | | |
| මුදල් හා මුදල් සමාන දෑ වලින් ශුද්ධ වැඩිවීම් | **83,009,668** | **-91,596,364** |
| වර්ෂ ආරම්භයේදී මුදල් හා මුදල්වලට ආසන්න දෑ | **16,880,838** | **108,477,202** |
| වර්ෂ අවසානයේදී මුදල් හා මුදල්වලට ආසන්න දෑ ශේෂය | **99,890,505** | **16,880,838** |

## ක්‍රීඩාංගණ අනුව ආදායම - 2020

| ක්‍රීඩාංගණය | මෙහෙයුම් අදායම | මෙහෙයුම් නොවන ආදායම |
|---|---|---|
| **සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය** | 17,002,352.00 | 348,412.00 |
| **සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය** | 21,200,135.00 | 262,040.00 |
| **ආර් ප්‍රේමදාස ක්‍රීඩාංගණය** | 2,750,000.00 | - |
| **බෝගම්බර ක්‍රීඩාංගණය** | 6,246,070.00 | 219,932.00 |
| **බෙලිඅත්ත පිහිණුම් තටාකය** | 425,500.00 | 21,270.00 |
| **නුවරඑළිය තුරඟතරඟ පිටිය** | 2,349,300.00 | 40,742.00 |
| මුළු ආදායම | **49,973,357.00** | **892,396.00** |

## ආයතනයේ සමස්ත ප්‍රගතිය

2011 වර්ෂයේ සිට 2020 වර්ෂය තෙක් ආයතනය විසින් උපයා ඇති ආදායම් පහත පරිදි විචලනය වී ඇත. කෙසේ නමුත් 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින ආයතනයේ සමස්ථ ආදායම තුන්ගුණයකට වැඩියෙන් පහළ වැටී ඇති බව පහත වගුවෙන් පෙන්නුම් කෙරේ. මීට බලපාන ලද ආසන්නතම හේතුව වූයේ ක්‍රීඩා ක්ෂෙත්‍රය පවත්වාගෙන යාමට තර්ජනයක් වූ රටතුල සීග්‍රයෙන් ව්‍යාප්ත වූ ගෝලීය කොරෝනා වසංගත රෝගී තත්වයයි.

2020 මාර්තු මස 11 වන දින පළමු කොරෝනා රෝගියා වාර්තාවීමත් සමඟ ආසාදිත රෝගීන් දිනෙන් දින ඉහළ යාම සිදුවන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රජය විසින් මහජනතාව අතර රෝග ව්‍යාප්තිය වැලැක්වීම සඳහා 2020 මාර්තු මස 22 දින සිට මැයි මස අවසානය වනතෙක් මුළු රටෙහිම නිරෝධයන ඇඳිරි නීතිය හා සංචරන සීමා පැනවීමට කටයුතු කරන ලදී. ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් වසංගත රෝගී තත්වය පාලනය කිරීම සඳහා ලබාදෙන ලද මාර්ගෝපදේශයන් වල මඟ පෙන්වීම යටතේ ආයතනික කටයුතු සැලසුම් කිරීමටත්, කාර්යය මණ්ඩලය කැඳවීමත් සිදුකරන ලදී.

රෝගී තත්වය පාලනය කිරීම සඳහා සෑම ආයතනකම පවත්වාගෙන යන කටයුතු වල ස්වභාවය අනුව ආරම්භ කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබාදුන් උපදෙස් පරිදි මෙම අධිකාරියටද ක්‍රීඩා කටයුතු ආරම්භ කිරීමට සිදුවූ අතර, ඒ සඳහා නිකුත් කරන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශ සියල්ල එලෙසම පිළිපැදීමට සිදුවන ලදී. ක්‍රීඩා කටයුතු සම්බන්ධව ලබාදුන් උපදෙස් යටතේ ක්‍රීඩා හා තරඟ ඉසව් දීර්ඝ කාලයක් ආරම්භ කිරීමට නොහැකි වන

ලදී.  මේ සඳහා හේතුවූයේ ක්‍රීඩා කටයුතු වලදී පිළිපැදිය යුතු සෞඛ්‍ය ආරක්ෂිත පියවර අනුගමනය කරමින් ක්‍රීඩා කටයුතු කිරීමට නොහැකි වීමයි. (මුඛ ආවරණ පැළඳීම, දෙදෙනෙකු අතර දුරස්ථබාවය රැකගනිම) පෙර වර්ෂ වල පැවැති ප්‍රාසාංගික වැඩසටහන් නොපැවැත්වීම ආදායම අහිමිවීමට බෙහෙවින් බලපාන ලදී.

ඒ අනුව කොවිඩ් රෝගී තත්වය පැතිරයාම සුළු වශයෙන් අඩුවූ අවස්ථාවේදී, පළමුව ආරම්භ වූයේ එළිමහනෙහි පැවැත්විය හැකි ක්‍රීඩා වැඩසටහන්(කණ්ඩායම් වශයෙන් නොව) පමණක් වන අතර, සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේ අදියර වශයෙන් පමණක් ක්‍රීඩා කටයුතු ආරම්භ කර පවත්වාගෙන යාමට අධිකාරියට සිදුවිය. මේ අවධියේදී වෙන්කර තිබූ බොහෝ ක්‍රීඩා අවලංගු වූ අතර, අලුතින් වෙන්කිරීම් සිදුනොකරන ලදී.

එමෙන්ම දෛනිකව සැලකියයුතු ආදායමක් ඉපයූ සුගතදාස එළිමහන් රඨගාල හා බෝගම්බර ක්‍රීඩාංගණයේ රඨගාල සඳහා පැමිණි වාහන ඉතාම අවම මට්ටමක පැමිනීමෙන් අධිකාරියට විශාල ආදායමක් අහිමිවී ඇති බව පෙන්නුම් කෙරේ.

| වර්ෂය | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම | 69.00 | 77.17 | 89.03 | 134.61 | 99.62 | 82.51 | 100.29 | 125.34 | 169.04 | 50.86 |




## ආයතනයේ මුළු ණය

2011 වර්ෂයේ සිට 2020 වර්ෂය තෙක් ණය තත්ත්වය පහත ආකාරයට විචලනය වී ඇත.

| වර්ෂය | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ණය | 42.95 | 42.04 | 41.00 | 45.00 | 44.00 | 43.70 | 40.254 | 39.995 | 26.819 | 25.22 |



විගණකාධිපති වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | SYA/A/SNSCA/01/20/04 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2022 මාර්තු 19 දින |

සභාපති,
සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය.

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි ප්‍රමිතියේ 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.706,536,074 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. එසේ වුවත්, මෙම වත්කම්වල ඵලදායි ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුව නැවත සමාලෝචනය කර ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පාරිතෝෂික වෙන්කිරීම රු.82,147,340 ක් වුවද නිවැරදි පාරිතෝෂික වෙන්කිරීම රු.83,270,195 ක් වුයෙන් පාරිතෝෂික වෙන්කිරීම හා වර්ෂයේ පාරිතෝෂික වියදම රු.1,122,855 කින් අඩුවෙන් දක්වා තිබීම නිසා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) ගිණුම්කරණ ප්‍රතිපත්ති 4.4 ප්‍රකාරව, ප්‍රාග්ධන ප්‍රදාන මත අත්පත් කරගනු ලබන වත්කම් ක්‍රමක්ෂය කිරීමට කටයුතු කරන බව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් 2002 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වර්ෂ 18 ක් තුළ අධිකාරිය වෙත ලැබී තිබුණු රු.මිලියන 2,671 ක් වූ වත්කම් ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලද වටිනාකම රු.195,063,403 ක් වූ ඉදිකිරීම් ව්‍යාපෘතින් 09 ක් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල නොනිමි වැඩ ශේෂය තුළ දක්වා තිබුණි. එම ව්‍යාපෘතින් පරීක්ෂා කර වැඩ නිමකිරීමේ සහතික ලබාදීමට කටයුතු නොකිරීම හේතුවෙන් භාවිතයට ගන්නා මෙම වත්කම්වල රු.7,358,187 ක් වූ ක්ෂයවීම් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඉ) නැවත අයකර ගත නොහැකි රු.8,418,371 ක් වූ එකතු කල අගය මත බදු මූල්‍ය ප්‍රකාශනයන්වල ගැලපීමට කටයුතු නොකර ජංගම වත්කම් යටතේ හඳුනා ගැනීම හේතුවෙන් ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ ණයගැතියන් තුළ ඇතුළත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික ඔලිම්පික් කමිටුව හා ක්‍රීඩා සංගම් 09 කින් අයවිය යුතු ශේෂවල එකතුව රු.8,982,811 ක් වුවද එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂවල එකතුව රු.3,004,959 ක් වූයෙන් මෙම ශේෂයන් අතර රු.5,055,523 ක වෙනසක් නිරීක්ෂණය විය.

(උ) සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති සමුච්චිත අලාභය රු.1,841,071,525 ක් සමුච්චිත අරමුදල ලෙස මූල්‍ය ප්‍රකාශනයන්වල දක්වනු වෙනුවට ඒකාබද්ධ අරමුදල ලෙස දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි..

අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙමෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණයන් හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා නියෝජ්‍යායතනයේ පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (l) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ), 1.2 (ඇ) සහ 1.2 (ඊ) ඡේදයේ සඳහන් නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගත්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති/ විධානයට යොමුව | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 හා 891 (1) | මුදල් භාරව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඇප ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ආ) 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008(i) (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති 05/2008 දරන චක්‍රලේඛය | (i) සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි.<br>(ii) මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඪ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ණ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

## 2.3 වෙනත් කරුණු

(අ) වර්ෂ 01 සිට 13 දක්වා කාලපරිච්ඡේදයක සිට පැවත එන වටිනාකම රු.22,370,836 ක් වූ ලැබිය යුතු (වෙළඳ) ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. වර්ෂ 04 ක කාලපරිච්ඡේදයක සිට පැවත එන ගිණුම් 02 කට අදාළ ප්‍රාග්ධන අත්තිකාරම් වටිනාකම රු.11,072,007 ක් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ක්‍රීඩාගාර, ක්‍රීඩාපිටි හා පිහිනුම් තටාක වෙන් කර ගැනීම වෙනුවෙන් ගෙවන ලද ආපසු ගෙවන තැන්පතු වටිනාකම රු.16,675,900 ක් වූ අතර එම අගය තුළ 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පැවති තවදුරටත් වගකීමක් නොමැති රු.11,936,484 ක් වූ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ 8 ක කාලපරිච්ඡේදයක සිට පැවත එන ලැබිය යුතු රඳවාගැනීමේ බදු රු.3,297,976 ක් ආදායම් බදු ගණනය කිරීමේ වාර්තාවල වාර්ෂිකව ඇතුලත් කර නොතිබීම හේතුවෙන් අයකර ගැනීමට නොහැකිව පැවතුණි.

(ඈ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරියට අයත් ආර්.ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය 2006 නොවැම්බර් 1 දින සිට කාර්තුවකට රු.750,000 බැගින් වූ ස්ථාවර බදු කුලියට වසර 30 ක බදු කාල සීමාවක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට බදු දීමට ගිවිසුම්ගත වී තිබුණි. එහෙත් යම්කිසි කාල සීමාවකට වරක් වෙළඳපල වටිනාකමට ගැලපෙන පරිදි බදු කුලිය සංශෝධනය කර ගැනීම සඳහා අදාළ කොන්දේසි බදු ගිවිසුමේ ඇතුළත් නොකිරීම හේතුවෙන් අධිකාරියට අයකරගත හැකි ආදායම අහිමි වී තිබුණි. තවද බදු ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ක්‍රීඩාංගනයේ සිදු කිරීම කිරීමට එකඟ වූ ඉදිකිරීමේ ව්‍යාපෘති දෙකක වැඩ සිදු කර නොතිබුණි.

(ඉ) 2015 වර්ෂයේ සිට පාරිතෝෂික දීමනා අරමුදලට අදාළ (Gratuity fund) මුදල් තැන්පත් කර ඇති අතර 2020 දෙසැම්බර් 31 දින වන විට ශේෂය රු.5,322,801 කි. එම මුදල් ඵලදායි ලෙස ආයෝජනය කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ආර්.ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය පවරනු ලැබූ අවස්ථාවේ ක්‍රීඩාංගනයේ පැවති වූ ක්‍රීඩා භාණ්ඩ උපකරණ වටිනාකම වූ රු.2,149,491 ක් 2020 මාර්තු 11 දිනැති අංක 31/2020 දරන කළමනාකරණ මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් අයකර ගැනීමට අනුමැතිය ලබාදී තිබුණි. නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටද මෙම අගය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම් කටයුතුවලදී භාවිතා කළ ජලය සහ විදුලිය සඳහා 2020 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් ආයතන 14 කින් අයවිය යුතු එකතුව රු.2,048,660 ක් කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඌ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ කාර්යමණ්ඩලය නවාතැන් ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතියේ වර්ෂ 2 ක හා මාස 5 ක කාල පමාවක් සුගතදාස එළිමහන් ක්‍රීඩාගාරයේ ප්‍රධාන දොරටුව හා අවට වානේ වැට ඉදිකිරීම් ව්‍යාපෘතිය වර්ෂ 2 ක කාල පමාවක් හා සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාගාරයේ ඇඳුම් මාරු කිරීමේ කාමර, වැසිකිළි හා ආපනශාලාව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ වර්ෂ 1 ක හා මාස 04 ක කාල පමාවක් 2021 දෙසැම්බර් 31 දිනට නිරීක්ෂණය විය. වැඩ නිම කිරීමේ අත්තිකාරම් සඳහා රු.28,878,856 ක් ගෙවා තිබුණු මෙම ව්‍යාපෘති නියමිත කාලය තුළ ඉදිකිරීම් කටයුතු නිම නොකිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘති තුනෙහි අයකර නොගත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල රු.11,585,802 ක් අධිකාරිය වෙත පියවා ගැනීමට ප්‍රමාද වී තිබුණි.

(එ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ පාපන්දු ක්‍රීඩාපිටියේ අලුත්වැඩියා හා වැඩිදියුණු කිරීමේ කටයුතු 2011 ඔක්තෝම්බර් 13 දිනැති කොන්ත්‍රාත් ගිවිසුම අනුව මාස 6 ක කාලයක් තුළ නිම කිරීම සඳහා රු.32,000,000 (බදු රහිත) ක් වූ අගයකට පෞද්ගලික ආයතනයක් වෙත ලබාදී තිබුණි. ක්‍රීඩාපිටිය නිම කිරීමෙන් පසුද පැවති අඩුපාඩු හේතුවෙන් ක්‍රීඩාපිටිය භාවිතා කළ නොහැකි තත්ත්වයකට පත්ව තිබුණි. මෙම ක්‍රීඩාපිටියේ අඩුපාඩු සකස් කරවා ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණු අතර මෙම කාර්යයන් සඳහා අධිකාරිය විසින් වැයකර තිබුණු රු.38,272,147 ක් ආපසු අයකර ගැනීම සඳහා නෛතික පියවර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඒ) ව්‍යාපෘතින්වල ඉදිකිරීම් කටයුතු නියමිත පරිදි සිදු නොකිරීම නිසා වර්ෂ 01 සිට 06 දක්වා කාලපරිච්ඡේදයක සිට පැවත එන රු.17,741,095 වූ රඳවාගත් මුදල්වල තවදුරටත් වගකීමක් නොමැති ශේෂයන් හඳුනාගෙන ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඓ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට සහකාර අධ්‍යක්ෂ මාධ්‍ය, විදුලි යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 02 ක් හා අභ්‍යන්තර විගණනක, නඩත්තු කටයුතු පිළිබඳ නිලධාරි, ප්‍රසම්පාදන නිලධාරි සහ ආරක්ෂක කළමනාකරු යන තෘතියික මට්ටමේ තනතුරු 04 ක් ඇතුළුව මුළු පුරප්පාඩු 69 ක් පැවති අතර එම පුරප්පාඩු පිරවීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

**<u>සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ ව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 වන වගන්තිය ප්‍රකාර ව විගණකාධිපති වාර්තාව සම්බන්ධ ව වත්මන් තත්ත්වය</u>**

**1.2 තත්ත්වාගණය කළ මතය සඳහා පදනම**

(අ) මෙම කාරණය වර්ෂ ගණනාවක සිට සිදු කර නොමැති අතර මෙය සිදු කරගෙන යෑමේ දී ප්‍රායෝගික ගැටලු රාශියක් පැන නැගුන බව කාරුණික ව සඳහන් කරමි. දැනට අප විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කරමින් පවතින නමුත් එහි ඇති වර්ෂ ගණනාවකට ඉහත දී මිලදී ගත් ඇතැම් අයිතම වර්ග සහ ඒවයේ පිරිවැය නිශ්චිත ව වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමේ අවශ්‍යතාවක් පවතී. එහෙත් මේ වන විට ඒ හා සම්බන්ධ අනෙකුත් පැරණි උපලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා පරීක්ෂා කරමින් අඩුපාඩු නිවැරදි කරමින් මෙම ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර ඇත. ප්‍රත්‍යාගණනය කළයුතු යැයි හඳුනාගත් වත්කම් පන්ති ප්‍රත්‍යාගණනය කිරීමට සුදුසු විෂය දැනුම ඇති කමිටු පත් කර මේ සම්බන්ධයෙන් අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කර ඇති අතර, 2022 වර්ෂයේ අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමේ දී අදාල ගිණුම්වල ගැලපීම් කටයුතු සිදු කර ඉදිරිපත් කරනු ලැබේ.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී මෙම වරද නිවැරදි කර ඉදිරිපත් කර ඇත.

(ඇ) ප්‍රාග්ධන ප්‍රදාන මත අත්පත් කර ගනු ලබන වත්කම් ක්‍රමක්ෂය කිරීම සම්බන්ධ ගැටලුව වර්ෂ ගණනාවක සිට පැවත එන්නක් වන අතර මේ සම්බන්ධ ව තොරතුරු අනාවරණය කර ගැනීමේ දි ප්‍රයෝගික ගැටලු රාශියක් පැන නැඟුණි. කෙසේ නමුත් පවතින තොරතුරු පදනම් කරගෙන 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී මෙම කටයුත්ත අවසන් කර අදාළ ගිණුම්වල ගැළපීම් සිදු කරන ලදී.

(ඈ) 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලද ව්‍යාපෘතිවලින් වටිනාකම රු. මිලියන 89.6ක් වූ ඉදිකිරීම් ව්‍යාපෘති නොනිමි වැඩ ගිණුමෙන් වත්කම් ගිණුමට 2022-05-31 දින වන විට මාරු කර ඇත. ඉතිරි ව්‍යාපෘති සඳහා ද වැඩ නිම කිරීමේ සහතික ලබාගෙන අදාළ වත්කම් ගිණුම්වලට මාරු කර ඊට අදාළ ක්ෂය ගණනය කිරීම් මූල්‍ය ප්‍රකාශනවල නියමිත පරිදි දැක්වීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී මෙම වරද නිවැරදි කර ඉදිරිපත් කර ඇත.

(ඊ) කළමනාකාරීත්ව මණ්ඩල සාමාජික ක්‍රියාකාරි අධ්‍යක්ෂ ඇතුළත් කමිටුවක් මඟින් ණය අය කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරන අතර 2022.06.01 දින වන විට මුළු ණය ගැතියන්ගෙන් රු .මිලියන 8.5ක් සහ මෙහි දක්වා ඇති සංගම් 09න් දැනට රු. මිලියන 0.3ක මුදලක් අය කර ගෙන ඇත. මෙහි සඳහන් නො සැසඳුණු ශේෂ සම්බන්ධයෙන් කිවහොත් 2022 පෙබරවාරි මස සියලු ම ණය ගැතියන් වෙත 2022-12-31 දිනට ශේෂ සනාථ කිරීම් ලිපි යවා ඇති අතර මෙතෙක් කිසිදු ආයතනයකින් නො සැසඳුණු ශේෂ සම්බන්ධ ව අප වෙත වාර්තා කර නොමැති බව කාරුණික ව දන්වා සිටිමි. කෙසේ නමුත් තවදුරටත් මේ සම්බන්ධයෙන් සොයා බලා නො සැසඳුණු ශේෂ වේ නම් එවා නිරාකරණය කර ගැනිමටත් කටයුතු කරනු ලැබේ.

(උ) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී මෙම වරද නිවැරදි කර ඉදිරිපත් කර ඇත.

2\. (අ) මුදල් භාරව කටයුතු කරන නිලධාරින් සඳහා ඇප තැන්පතු ලබාගැනිමට කළමනාකාරීත්ව

මණ්ඩල අනුමැතිය ලබාදී ඇති අතර, එක් එක් නිලධාරීන් සඳහා ඇප මුදල් ලබාගෙන තැන්පත් කිරීමට මේවන විට ක්‍රියාමාර්ග ගෙන ඇත.

(ආ) (i) 2022 වර්ෂයේදී පළමු අදියර යටතේ මාණ්ඩලික නිලධාරීන් සඳහා වාර්ෂික කාර්ය සාධන ගිණුම් වාර්ථා පිළියෙල කර ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු ඇත.

(ii) මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම සහකාර අධ්‍යක්ෂ (පාලන) වෙත පවරා ඇති රාජකාර වගකීම වේ.

**2.3 වෙනත් කරුණු**

(අ) 2022.06.30 දින වන විට මුළු ණය ගැතියන්ගෙන් රු. මිලියන 8.5ක් අය කර ගෙන ඇත. ඉතිරි ලැබියයුතු ශේෂය සහ විශේෂයෙන් දීර්ඝ කාලයක් තිස්සේ ලැබියයුතු ශේෂ අය කර ගැනීමට අධිකාරියේ බොල්ණය වෙන් කිරීම හා කපා හැරීමේ ප්‍රතිපත්තිය හා සම්බන්ධ ව පත් කර ඇති කමිටුව මඟින් දැනට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. ඒ අනුව දැනට හිඟ මුදල් අය වියයුතු ආයතන ප්‍රධානීන් සමඟ විටින් විට සාකච්ජා සහ සිහිකැඳවීම් ලිපි මඟින් දැනුවත් කර ඇති අතර ඉදිරියෙ දීත් මෙම ආයතන වෙත දැනුවත් කිරීම් සිදු කිරීමට නියමිත අතර සියලු ආයතනවලට එන්තරවාසි යැවීමටත්, ඒ සම්බන්ධ වත් ප්‍රතිචාර නො දක්වන ආයතන වෙත නිති මඟින් කටයුතු කිරීමට සුදානම් කර ඇත.

දැනට මෙම ව්‍යාපෘතිවලට අදාළ අවසන් බිල්පත් හා අන්තර් බිල්පත් ලැබී ඇති අතර එම බිල්පත් ගෙවීම් කිරීමේ දී මෙම අත්තිකාරම් මුදල් හිලවු කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) එම වරද නිවැරදි කර ගනිමින් 2021 වර්ෂයේ දෙසැම්බර් මස රු. 10,569,446.52ක මුදලක් ආදායමට ගැනිමට කටයුතු කරන ලදී.

(ඇ) මෙම රඳවා ගැනීමේ බදු දීර්ඝ කාලයක් සිට වාර්ෂික ව මුල්‍ය ප්‍රකාශනවල සටහන් වන නමුත් අප අධිකාරිය (පාඩු ලබන ආයතනයක් වන හෙයින්) විසින් ආදායම් බදු ගෙවීමට අදාළ නො වන බැවින් ආදායම් බදු ගණන කිරීමේ දී එම වාර්තාවලට ගැළපීම් සිදු කිරීමට අවශ්‍ය නො වූ අතර මේ හේතුවෙන් එම ගිණුමේ මෙම ශේෂය පවතී. කෙසේ නමුත් වර්ෂ දෙකකට වඩා පැරණි රඳවා ගැනිමේ බදු ආදායම් බදුවලට හිලවු කළ නොහැකි බැවින් එය පරීක්ෂා කර බලා 2022 මුල්‍ය ප්‍රකාශශ ඉදිරිපත් කිරීමේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) බදු ගිවිසුම සංශෝධන කිරීම සම්බන්ධයෙන් යම් යම් උපදෙස් ලැබී ඇති අතර පැහැදිලි උපදෙසක් ලබා ගැනීම සඳහා අධිකාරියේ නීති අංශය හරහා නීතිපතිගෙන් උපදෙස් ඉල්ලා ඇත. එම උපදෙස් ලැබුණු පසු බදු ගිවිසුම් සංශෝධන කර ඒ අනුව කටයුතු කරනු ලැබේ.

(ඉ) 2022 වර්ෂයේ දී පාරිතෝෂිත ගෙවීම් සඳහා පුනරාවර්ථන වියදම් යටතේ මුදල් අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කිරීමට ඉල්ලීම් නො කළ අතර මෙම වර්ෂයේ සිට පාරිතෝෂිත අරමුදලේ ඇති මුදල්වලින් පාරිතෝෂිත ගෙවීම් නිදහස් කරන අතර නිදහස් නො කරන මුදල් ගණන් බලා ඵලදායි ව ආයෝජනය කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඊ) බදු ගිවිසුම සංශෝධන කිරීම සම්බන්ධයෙන් යම් යම් උපදෙස් ලැබී ඇති අතර පැහැදිලි උපදෙසක් ලබා ගැනීම සඳහා අධිකාරියේ නීති අංශය හරහා නීතිපතිගෙන් උපදෙස් ඉල්ලා ඇත. එම උපදෙස් ලැබුණු පසු බදු ගිවිසුම් සංශෝධන කර ඒ අනුව කටයුතු කරන අතර තොග ආලාභය අයකර ගැනීම සම්බන්ධයෙන් ද එම උපදෙස් මත කටයුතු කරනු ලැබේ.

(උ) දැනට මෙහි සඳහන් ඉදිකිරීම් ආයතන 14න් අය වියයුතු මුදලින් රු. 1,019,165.31ක් අදාළ කොන්ත්‍රාත් ආයතනය මඟින් අය කර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි අය වියයුතු මුදල් ඉදිරියේ දී ගෙවන බිල්පත් මඟින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඍ) නවාතැන් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ව්‍යාපෘතියට අදාළ ව එහි ඉදිකිරීම් කටයුතු සිදු කරගෙන යන අතරතුර දී කොවිඩ් 19 වසංගත තත්වය ඇතිවීම හා රට තුළ සංචරණ සීමා පැනවීමත්, හේතු කොටගෙන මෙම ගොඩනැගිල්ල රටේ අවශ්‍යතාව මත නිරෝධානය වන පුද්ගලයන්හට නිරෝධායන මධ්‍යස්ථානයක් ලෙස ලබා දීම හා අමුද්‍රව්‍යවල ගිහ බව හා කාලගුණික තත්ත්වයන් සැලකිල්ලට ගෙන උපදේශක ආයතනය විසින් ඉදිකිරීම් කාලය දීර්ඝ කිරිමට නිර්දේශය ලබා දී ඇත. තව ද මෙම ව්‍යාපෘතියට අදාළ ව භෞතික වශයෙන් අවසන් කළ භාරදීම් හා භාරගැනීම් සිදු කර ඇත. එහෙත් අමතර කාර්යයන් සඳහා කොන්ත්‍රාත් ආයතනය මඟින් අනුමැතිය ලබා ගෙන නොමැති නිසා උපදේශන ආයතනය වෙතින් අවසන් බිල්පත නිර්දේශ කර ඉදිරිපත් කර නැත. ඉදිරිපත් වී තිබෙන හතර වන බිල්පතේ මුළු වටිනාකම අයකිරීමට නියමිත අත්තිකාරම් මුදලට වඩා අඩු හෙයින් අවසන් බිල්පත ද ලද පසු එම බිල්පත් දෙකෙන් ම අත්තිකාරම් මුදල අය කිරීමට සුදානම් කර ඇත. එහෙයින් එතෙක් අත්තිකාරමක් අයවීමට ඇති බව ගිණුම් කටයුතුවල දී පිළිබිඹු කරන බව සලකනු මැනවි.

ඇඳුම් මාරු කිරීමේ කාමර හා ආපනශාලා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියට අදාළ ව ව්‍යාපෘති කටයුතු 2018 වර්ෂයේ අවසන් කරන ලදී. එමෙන් ම මෙම ව්‍යාපෘතිය සිදු කරන ලද ගොඩනැගිල්ල වසර 20කට වඩා පැරණි ගොඩනැගිල්ලක් වන බැවින් මෙහි අලුත්වැඩියා කටයුතු සිදු කළ නමුත් යම් යම් අඩුපාඩු මතුවීම හේතුවෙන් භාරදීම් හා භාරගැනිම් කටයුතු සිදු කිරිමට ප්‍රමාද විය. කෙසේ නමුත් දැනට මෙම ව්‍යාපෘතියට අදාළ අවසන් බිල්පත උපදේශන ආයතනය විසින් නිර්දේශ කර ඉදිරිපත් කර ඇති අතර එයින් සම්පූර්ණ අත්තිකාරම් මුදල අඩු කර ඇත. එහෙත් වැඩ අවසන් කිරීමේ සහතිකය මේ වන තෙක් නිකුත් නො කිරීම හේතුවෙන් ගෙවීම් කටයුතු සිදු කර නොමැති නිසා මෙම මුදල අත්තිකාරම් ගිණුමේ පෙන්වයි.

මෙම ව්‍යාපෘතියට අදාළ අත්තිකාරම් ශේෂය මේ වන විට නිරවුල් කිරීමට කටයුතු කර ඇත.

(එ) මේ සම්බන්ධයෙන් දිගින් දිගට ම කොන්ත්‍රාත් ආයතනය වෙත අඩුපාඩු දන්වා ලිඛිත ව දැනුම් දෙන ලදී. ඒ අනුව විටින් විට කොන්ත්‍රාත් ආයතනය මඟින් අඩුපාඩු පිළිසකර කටයුතු සිදු කරන ලදී. එහෙත් අධිකාරියට ඒ සම්බන්ධයෙන් සෑහීමකට පත් විය නොහැකි හෙයින් එවකට සිටි අධ්‍යක්ෂ මණ්ඩලය හා සභාපතිතුමා විසින් නීතිපතිතුමාගේ උපදෙස්වලට අනුව ලංකාවේ එක ම ජාත්‍යන්තර ආයතනය වන මෙම ක්‍රීඩාංගණය රටේ ක්‍රීඩකයින්හට ක්‍රීඩා ඉසවු සහ පුහුණුවීම් කටයුතු සිදු කිරීමට නොහැකි වීම නිසා නැවත ධාවන පථය හා ක්‍රීඩාංගණය නවීකරණ කටයුතු සිදු කරන ලදී. කෙසේ නමුත් මෙම ඉදිකිරීම් කාලසීමාව තුළ වරින් වර අඩුපාඩු නිරීක්ෂණය වූ අතර ඒ පිළිබඳ ව කොන්ත්‍රාත්කරු දැනුවත් කොට අවසන් බිල්පත සහ රඳවුම් මුදල (රු.11,000,000/=) නො ගෙවීමට තීරණය කොට ඇත.

(ඒ) මෙම වටිනාකමට අදාළ රඳවා ගත් මුදල් මේ වන තෙක් ඉල්ලීම් කර නොමැති අතර අඩුපාඩු නොමැති නම් මුදල් නිදහස් කිරීමටත් ඉතිරි මුදල් ආදායමට ගැනිමටත් කටයුතු කරනු ලැබේ.

(ඓ) මෙම වර්ෂයේදී අත්‍යවශ්‍ය පුරප්පාඩු තනතුරු බඳවාගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පලකර අයදුම්පත් කැඳවා තිබුනද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද චක්‍රෙල්ඛ DMS/Policy/Recruitment අංක දරණ 2019.11.20 දිනැති චක්‍රෙල්ඛය හා DMS/Cir/2020 අංක දරණ 2020.02.21 දිනැති චක්‍රෙල්ඛ වලින් ලබාදෙන ලද උපදෙස් අනුව බඳවාගැනීම් සිදුකිරීමට නොහැකි විය. නමුත් ආයතනයේ පරිපාලන කටයුතු පවත්වා ගෙන යාමට අත්‍යවශ්‍ය වූ නඩත්තු නිලධාරි තනතුර හා තාක්ෂණික සහකාර තනතුරු සඳහා සාධාරණීකරනය කර ලබාගන්නා ලද අනුමැතියට අනුව එම තනතුරු දෙක 2022 වර්ෂයේදී බඳවාගන්නා ලදී.

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය,**
**තැ.පෙ.2211, ආතර් ද සිල්වා මාවත,**
**කොළඹ 13.**

දුරකථන : **0112 384 385 / 0112 445 677**
ෆැක්ස් : **0112 44 56 75**
විද්‍යුත් තැපැල් : **sugathadasaindoor@gmail.com**

බෝගම්බර ක්‍රීඩාංගණය
**081 22 35 395**

නුවරඑළිය තුරඟතරග පිටිය
**052 22 22 659**

බෙලිඅත්ත පිහිණුම් තටාකය
**047 22 51 685**